# සැඳෑව
## சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2017 ජුලි - දෙසැම්බර්

වෙබ් අඩවිය : www.sendewa.org
විද්‍යුත් ලිපිනය : wimalajaya@gmail.com





අංක : QD/50/පුවත්/2018 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




## සුබ නව වසරක් වේවා !

වේවා! උදා සුබදායී නව වසරක්
කරවා නිදුක් සුවපත් ඔබ හැමට පසක්
රඳවා පසෙකලා ඇති ඉල්ලීම් රැසක්
කරවා ගන්ට පතනෙමු පලදායී ලෙසක්

**විධායක කමිටුව**



## අධිපතිතුමා හමුවීම

ශ්‍රී ලංකා මහබැංකු විශ්‍රාමික සංගමය 2017 දෙසැම්බර් මස 11 දින මහබැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සමඟ සුහද සාකච්ඡාවක් පවත්වන ලදී. සංගමයේ සභාපති ජයලාල් ජයවර්ධන මහතා සමඟ ලේකම් ආරියදාස තන්ත්‍රිගේ, භාණ්ඩාගාරික ආර්. ඩී. ගුණසේන, උපසභාපති ලක්ෂ්මන් ද සිල්වා, උපලේකම් බන්දුල විමලසූරිය, උප භාණ්ඩාගාරික එල්. එල්. එම්. ඩී. කබ්රාල් කමිටු සාමාජික එච්. එම්. පී. හේරත්, ලීලා මෝහන සුන්දරම් ඥානා රණතුංග සහ සඟරා සංස්කාරක අමරපාල කරසිංහආරච්චි යන මහත්ම මහත්මීහු සාකච්ඡාවට සහභාගි වූහ.

මහබැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සමඟ නියෝජ්‍ය අධිපති කේ. ඩී. රණසිංහ සහකාර අධිපතිවරුන් වන එස්. ජේ. පී. හඳගම, එච්. ඒ. කරුණාරත්න, ලේකම් බී. ඩබ්ලිව් ජිනසේන, අධ්‍යක්ෂවරුන් වන ටී. එම්. ටී. සරත්චන්ද්‍ර, පී. බී. එල්. නන්දසිරි යන මහත්වරුන්ට අමතරව තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීහු කිහිපදෙනෙක් ද සාකච්ඡාවට සම්බන්ධ වූහ.

සංගමයේ සභාපතිතුමා විසින් ප්‍රථමයෙන්ම තම නිලධාරි මණ්ඩලය අධිපතිතුමාට හඳුන්වා දෙන ලදී. අනතුරුව මෙම සම්මුඛ සාකච්ඡාව ලබාදීම සම්බන්ධයෙන් පළමුව තම ස්තූතිය අධිපතිතුමා වෙත පලකරන ලදී. කාර්ය බහුලත්වය නිසා සංගමයේ එක්දින හමුවට සහභාගී වීමට අධිපතිතුමාට නොහැකිවූවත් සංගමයේ ඉල්ලීම් වලට සුබවාදීව ප්‍රතිචාර දැක්වීම විශ්‍රාමිකයනට දක්වන ගෞරවයක් ලෙස සලකන බව ද සභාපතිතුමා විසින් වැඩි දුරටත් පළකර සිටින ලදී. සංගමයේ කාර්යාලය පවත්වාගැනීමට පරිශ්‍රයක් ලබාදීම, එදිනට රථගාල පාවිච්චි කිරීමට අවසරය ලබාදීම වැනි දේ ඉතා විශේෂ වන බව ද පවසා සිටින ලදී.

අනතුරුව සංගමයේ ප්‍රධාන ඉල්ලීම වන 2018 වර්ෂයට විශ්‍රාම වැටුප් වැඩිකිරීමට අදාලව දීර්ඝ කරුණු ඉදිරිපත් කිරීම සභාපතිතුමා විසින් සිදුකරන ලදී. මෙම කරුණු ඉදිරිපත් කිරීමට පාදක වූ විධායක කමිටු වාර්තාව අනුව සකස් කරන ලද ලිපියක් මෙම කලාපයේ **5** පිටුවේ ''**මහබැංකු විශ්‍රාමික වැටුප් ගැටලුවට තිරසාර විසඳුමක්**'' නම් මාතෘකාව යටතේ ඉදිරිපත් කර ඇත. එසේම මෙම සාකච්ඡාවේදී සභාපතිතුමා විසින් සිදුකළ කථාවේ සාරාංශයක්ද මෙම කලාපයේම **3** පිටුවේ **Discussion with the Governer on 11th December 2017** නම් මාතෘකාව යටතේ පළකර ඇත. අධිපතිතුමා වෙත ඉදිරිපත් කළ අපගේ ප්‍රධාන ඉල්ලීම් තුන පහත දැක්වේ.

(1) වසර 2006 දක්වා දැනටමත් යාවත්කාලීන කරන ලද මහබැංකු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් 2015 දක්වා යාවත්කාලීන කිරීම,

(2) ඉදිරියේදී 2018 වසරට අදාලව මහ බැංකු සේවකයනට ලබාදෙනු ලබන වැටුප් වැඩිවීම් වලින් 70% ප්‍රමාණයක් පංතිය, ශ්‍රේණිය හා සේවා කාලය, කල්පිතව ගණනය කොට විශ්‍රාමිකයන්ටද ලබාදීම,

(3) 2006 වසරට මහබැංකු විශ්‍රාමිකයින්ගේ වැටුප් යාවත්කාලීන කිරීම පිළිබඳ ක්‍රමවේදය ලබාදීම.

මෙම ප්‍රධාන කරුණුවලට අමතරව පහත සඳහන් කරුණු 5 කෙරෙහිද අධිපතිතුමාගේ අවධානය යොමු කරන ලදී.

(i) භාෂා ප්‍රතිපත්තිය මත විශ්‍රාම ගිය වයස්ගතවී ඇති විශ්‍රාමිකයින් ස්වල්පදෙනාට සානුකම්පිත හේතූන් මත සලකා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ පහසුකම් ලබාදීම.

(ii) මහබැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යාවත්කාලීන කිරීමට අදාලව සංගමයේ සාමාජිකයින් විසින් ඉදිරිපත්කොට ඇති යෝජනා සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලසේවා කළමනාකරණ අධ්‍යක්ෂතුමා සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා දීම.

(iii) රජයේ විශ්‍රාමිකයින්ට නිවාඩු ගමන් බලපත්‍ර වාර 3 ක් ලබාදෙනු ලබන බැවින් මහබැංකු විශ්‍රාමිකයන්ටද එම වරප්‍රසාදය ලබාදීම.

(iv) මහබැංකුවේ 60 වන සංවත්සරය සඳහා ප්‍රදානය කරන ලද වැටුප් වර්ධක 2010 වර්ෂයේ අගෝස්තු මස 20 වන දින සහ සැප්තැම්බර් මස 30 දින අතර සේවයෙන් විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ට නොලැබී යාම.

(v) මහබැංකු විශ්‍රාමිකයන්ට අදාල වන චක්‍රලේඛන විශ්‍රාමිකයන්ට කෙලින්ම ලැබෙන්ට සැලැස්වීම.

මෙම සාකච්ඡාවේ සමාප්ති අවස්ථාවේදී සිය දීර්ඝකාලීන රාජකාරි අත්දැකීම් මත පිහිටා කාරක සභික ශ්‍රද්ධානා රණතුංග මහත්මිය විශ්‍රාමිකයන්ට මුහුණදීමට සිදුවන බොහෝ දෙනෙකු නොදන්නා කරුණු කාරණා පිළිබඳව කරන ලද විග්‍රහය සැමගේ දැඩි අවධානයට යොමු විය.

ඊට අමතර වශයෙන් 2002 වර්ෂයේදී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය පිරිසට බලපාන ප්‍රශ්න පිළිබඳව අදහස් රාශියක්ද ඇයගේ මැදිහත්වීම තුල දක්නට ලැබිණ.

එම නිසා විශ්‍රාමික සංගමය අධිපතිතුමා සමඟ පැවැත්වූ සාකච්ඡාව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැක. සංගමය ඉදිරිපත් කළ කරුණු කාරණා කෙරෙහි ප්‍රතිවිරෝධිතාවයන් එල්ල වූයේ නැත. ආයතනය අපහසුතාවයට පත්වන ක්‍රියාවලින් ඈත්ව සිටීම අපගේ ප්‍රතිපත්තියයි. අප කරුණු ඉදිරිපත් කරන්නේ තර්කානුකූල පදනමක් මත හඳවතට එකඟවය.

## සංස්කාරක සටහන

"සැදෑව" 2017 ජූලි - සැප්තැම්බර් කලාපය බලාපොරොත්තු වූ කාලසීමාව තුළ එළිදැක්වීමට නොහැකි විය. එම නිසා 2017 ජූලි - දෙසැම්බර් කාලයටම අදාල වන සේ මෙවර කලාපය සකස්වී ඇත. කලාපයේ පමාවට විවිධ හේතූන් බලපෑවේය. ඔබට අවශ්‍ය තොරතුරු සියල්ල සැපයීම "සැදෑවේ" ප්‍රධාන අරමුණයි. එම නිසා කාල පමාව තොරතුරු සැපයීම කෙරෙහි බලපෑවේ නැත. බස් රථය පමා වන විට ඊළඟ බසයෙන් යාමට සූදානම්ව සිටින අයත් පටවා ගන්නට හිත හොඳ කොන්දොස්තරට සිදු වේ. අපටත් එසේමය.

"සැදෑව" ඔබට තොරතුරු සපයන්නේ ඒවා කියවා අමතක කර දැමීමට නොවේ. විශ්‍රාමික සංගමයේ නායකයින්ට ඉදිරියෙන් සිටිය හැකි ප්‍රබුද්ධ සාමාජිකත්වයක් අපට සිටී. සමහරවිට මෙවර කලාපයේ තොරතුරු සියල්ල එක හුස්මට කියවීමට අපහසු විය හැකිය. නිවී සැනසිල්ලේ කියවා තේරුම් ගෙන සංගමයට පහන් තරුවක් වන්න.

**ඔබට ඉක්මනින් සන්නිවේදනය කළ යුතු තොරතුරු හා දැනුවත් කිරීම් රාශියක් මෙම කලාපයට ඇතුලත් කිරීමට සිදු වීම නිසා පල කිරීමට සූදානම් කළ ලිපි රාශියක් ඊළඟ කලාපයට ඇතුලත් කිරීමට සිදු විය**. මීලඟ කලාපයට අවශ්‍ය ලිපි දැනටමත් අප සතුව තිබෙන බැවින් ඉදිරි කළාපය ඉක්මනින් ඔබ අතට පත් කිරීමට බලාපොරොත්තු වෙමු.

"සැදෑව" ගරු සංස්කාරක අමරපාල කරසිංහආරච්චි මහතාගේ සුරතේ ආබාධයක් නිසා නිවාඩු ලබා දීමට සිදු විය. ඔහුට ඉක්මන් සුවය ලැබේවායි "සැදෑව" ප්‍රාර්ථනය කරන අතර ඔබ සැමගේත් ප්‍රාර්ථනය ද එයම බව අපි විශ්වාස කරමු. විධායක කමිටුව විසින් ර.මු. සෙනෙවිරත්න මහතා ගරු සංස්කාරක ධුරයට පත් කර ඇත.

බසය පමා වන විට ඊළඟ බසයෙන් යාමට සිටි අයත් ගොඩවන නිසා ගමන තරමක් අපහසුය. කාල පමාවක් ද සිදු වෙයි. නමුත් ගමනාන්තයට පැමිණි විට සැවොම තුටු වෙති.

මෙවර "සැදෑව" කියවා අවසානයේ ඔබටත් සතුටු සිතින් පමාවට සමාව දිය හැකි නම් එය අපගේ ප්‍රසාදයට හේතු වන්නේය.

කාර්ය මණ්ඩල සේවා කළමණාකරණ දෙපාර්තමේන්තුවට (සුභසාධක) සම්බන්ධව ඔබට අවශ්‍ය තොරතුරු දැන ගැනීම සඳහා කලින් පත්කර සිටි නිළධාරිනිය වෙනුවට පහත නම් සඳහන් නිළධාරියා 2018 ජනවාරි මස 01 වන දින සිට පත් කර ඇති බව අපට දන්වා එවා ඇත.

**ඒ.ජී.එස්. පාලිත මහතා**
**0112477570**

# Discussion with the Governor on 11.December 2017.

## 1.Updating the pension to 2015 Jan 01st.

Governor, first of all I would like to thank you for granting us an interview. This is the first interview that is being granted to the new committee appointed at the AGM held on 31st April 2017. We know the busy schedule you have which also prevented you from attending the annual get together of the association on 31st October 2017.Sir, I would like to thank you for granting Office space at the center point building and allowing us to use the CBSL car park, and also arranging to give a commitment letter to hospitals, continue the existing practice of payment of income tax, and appointment an officer to answer inquiries from pensioners in the Staff Facilities Management Dept:. Now I would like to introduce the committee to you Sir. I am Jayalal Jayawardena, President, and now I invite other committee members to introduce themself.

Sir, our first request in respect of pension increase is that to adopt the Methodology implemented by the Government with effect from 01st July 2015, on the basis of its P.A. Circular No. 16/2015 dated 25th June 2015.for the rectification of pension anomalies of the CBSL. Our proposal is an upward revision of pensions of the CBSL employees who retired on or before 31st Jan 2015 by computing their last drawn monthly salaries hypothetically on the basis of their corresponding due salary steps on the scales as at 31st Jan 2015, and paying 70% of the increase of salary in 2018 to present staff. Their pensions are computed depending on the number of years in service. (I.e. 65%, 75% or 90% of the last drawn salary.) Salary revisions were given in the years 1997; 2000; 2003; 2006; 2009; 2012; 2015. Next revision will be in 2018. From year 2000 to 2012 we received very small increases and it was rectified to some extent in 2015 by updating the pension to 2006.However, on numerous occasions we have asked for the methodology used for this action. We are very sad to point out that we did not receive a reply.

Sir, According to MLA section 120 The Governor and the members of the Monitory Board and Officers of the CBSL shall be deemed to be public Servants, within the meaning and for the purposes of chapter 1X of the penal code.

**There are number of circulars where pension of public servants were revised.**

They are: Circular numbers Nos.15/2003; 09/2004; 2/2006; 6/2006; 05/2015 and lastly No. 16/2015.

The existing Central Bank Pension scheme which came to operation with effect from 01.01.1965 for the employees recruited up to 31st December 1997 is a scheme more or less formulated in terms of the government pension scheme. Most of the pensioners who were responsible for achieving this scheme of pension are not living today. A few of them are there and they are our members. The employees of the CBSL ALSO SUBJECTED TO CERTAIN PROVISIONS OF GOVT: CIRCULARS. They are, irrespect of overseas travel allowances, obtaining PM's approval to leave the country, engagement of election duty, and duty free permit for importation of motor vehicles etc.

When granting percentage increases, certain cut off points are arbitrary selected without adhering to any consistent methodology. The high increases granted to some high level officers in 2015. If you compare a staff class special grade officer who retired prior to 1st Jan 2009, (prior to increase in 2009) receives a basic pension much less than a same grade officer who retired after 1st Jan 2015. Furthermore, his pension is less than a S.O.Grade 1 officer who retired on 1st Jan 2015.

Government is adopting National Salaries and carders commission recommendations; to grant 70% of the salary increase granted to current employees to the Pensioners. Former President His Excellency Mahinda Rajapaksa in his Budget speech in November 2014 for the year 2015 gave effect to the above recommendations of the commission. Present Govt: also going by that Rs. 3500/= granted to govt:

pensioners in 2015 is exactly the 70% of Rs.5000/= Granted to present employees. Therefore, as a policy if CBSL decided to grant 70% of the salary increase granted to present employees of the CBSL to pensioners, all the anomalies will be settled. But the CBSL increases did not match this requirement and followed govt. payment amounting to Rs. 3500/= and gave it to CBSL pensioners. This amount does not equal 70% recommended by National Salaries Commission when compared with increases given to present staff. We do understand the urgency and difficulty in getting correct particulars of pensioners at that time. Now these problems are solved and the Bank does have all the particulars of the pensioners. It would be easy to rectify the anomalies.

I would like to mention that those who were in upper grades those days also thought the same manner as of present. But now they are also feeling the heat and agitating pension revision. As for the teachings of the lord Buddha nothing is permanent, everything is changing. So please think that in a few years all who are representing management here will retire and fall into our category. After some time these very seats will be occupied by new comers who joined the bank after 1997.Who do not eligible to same pension as we are. Therefore, it would be better to have an everlasting policy. Those who retire now will feel the same way after some years. Those who joined prior to 1997 would receive a pension of 60% 70% and 90% depending on number of years in service. If you had put on more than 30 years of service you will get 90% of salary at retirement. This also formulated on the basis of Government practice.

Another point I would like to emphasize is that life expectancy is around 75 years, thanks to development of modern medicine and skills of modern doctors. As it is we have older members who have passed this age. We wish them Dirgayu, Long life but we have to face facts. We must not forget facts. Most of our members will be passed away by the year 2035. All these pensioners were the pensioners who raised the bank in difficult times of the Bank. Those are: Fire in 1968, Insurgency in 1971and 1989; and bomb blast in 1996. These men and women worked under trying conditions without any of the modern facilities, as present staff. If not for their effort CBSL would not have been of this state today.

Another factor is the cost. I hope it will not be much. I think you would have incurred much more cost when granting increases to present staff in 2015 of CBSL.

I request sir, you to take in to consideration these facts and decide favorably.

2. Increments given at the time of the 60th year commemoration of the Central Bank were not granted to officers who retired between 28.08.2016 and 30. 09. 2016. This was taken up with the former DG Mr. Lankatilaka. He said that he would look into this. But he retired.

3. We request to send all relevant circulars to pensioners.

4. We request to give three sets of Railway warrants to pensioners as the Government, has already given this to public sector pensioners.

5. We request you to consider Grievances of those who retired on language issue. No. of pensioners are very few and all of them are now over 75 years old. They have passed the life expectancy age. Granting them medical benefits at least on sympathetic grounds would be meritorious action.

6. We have some proposals sent to us from our members with regard to Services Management Dept: We would like to take up these issues with the director of the dept: on another day. Please ask Director to give us a hearing.

7. Our letters sent to D/HR: we have requested to give us the methodology or procedure adopted when updating pension to 2006. But we have not received a reply as yet. I would like to state that according to Right for information act we have a right for that information. Our members are agitating this information.

Jayalal Jayawardena.
President
Central Bank Pensioners' Association.

# මහබැංකු විශ්‍රාමික වැටුප් ගැටළුවට තිරසාර විසඳුමක්

වසර 1965 දී කලින් පැවති විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමය වෙනුවට ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහබැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය 1997 දී අත් හිටවන ලදී. මහ බැංකුවේ විශ්‍රාම වැටුප් ක්‍රමය සකස් කිරීමේදී එවැන්නක් ගැන හසළ අත්දැකීම් ලබා තිබූ රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ භාවිතාවන් අඩු වැඩි වශයෙන් අනුගමනය කරනු ලැබීය. 1985 දී විශ්‍රාම වැටුප් ගණනය කිරීමට රජය අනුගමනය කළ ක්‍රමය අනුව යමින් අවසාන වැටුප, සේවා කාලය හා විශ්‍රාම යන වයස මත තම විශ්‍රාම වැටුප් ක්‍රමය ද සකස් කළ මහ බැංකුව 1990 දී රජය සිදු කරන ලද පරිදිම අවසාන වැටුප 90% ක ප්‍රතිශතයක් තම විශ්‍රාමිකයින් වෙනුවෙන්ද ලබා දුන්නේය. මහබැංකුවට වඩා විශාල ප්‍රමාණයක විශ්‍රාමික පිරිසක් වෙනුවෙන් කාලාන්තරයක් තිස්සේ කටයුතු කිරීම නිසා විශ්‍රාමිකයින්ගේ ගැටළු සම්බන්ධයෙන් මහබැංකුවට වඩා හොඳ පරිචයක් රජයට ඇති බව පිළිගත යුතුය.

එම නිසා ලක්ෂ සංඛ්‍යාත විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් රජය ගන්නා තීන්දු තීරණ හොඳින් හිතාමතා මනා අධ්‍යයනයකින් පසුව ක්‍රියාත්මක කරන ඒවා බැවින් මහබැංකුව රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය ගුරුකොට තැකීම මදිපුංචිකමකට හේතු වන්නේ නැත.

මහබැංකු විශ්‍රාම වැටුප් ගැටළුව ගැන සොයා බැලීමේදී රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය පසුබිමින් තබා හැදෑරීම ප්‍රශංසාගෝචරය. සාමාන්‍යයෙන් රජයේ සේවකයනට හා විශ්‍රාමිකයින්ට යම් වැටුප් වැඩිවීමක් ලබා දෙන්නේ වාර්ෂික අය-වැය ලේඛණය මගිනි. රජයේ සේවකයාත් රජයේ විශ්‍රාමිකයාත් අතර අවියෝජනීය සහ සම්බන්ධයක් පවතින බව සෑම රජයක්ම විශ්වාස කර ඇත.

අතීතයේදී කලින් කලට වෙනත් ඉල්ලීම් හා මුසුව වැටුප් වැඩිවීම් ලබා ගත්තද 1997 තරම් කාලයේදී වසර තුනකට වරක් වැටුප් වැඩි කිරීමේ ක්‍රමවේදය මහබැංකුව තුළ ක්‍රියාත්මක විය. ඒ අනුව 1997, 2000, 2003, 2006, 2009, 2012, 2015 වර්ෂවලදී වැටුප් වැඩිවීම් සිදුවූ අතර ඉදිරි වැඩිවීම් 2018 සිදුවීමට නියමිතය. මහබැංකුවේ මාසික විශ්‍රාම වැටුප් ලබාගන්නා විශ්‍රාමික පිරිස බිහිවන්නේ 1970 මැද භාගයේ සිටය. සාමාන්‍යයෙන් සේවකයින්ට වැටුප් වැඩිවීමක් ලබාදුන් පසු විශ්‍රාමිකයින්ට ද යම් වැඩිවීමක් ලබා දෙන ලදී. එසේම සේවක කොටස්වලට ලබාදෙන වැටුපෙන් 20% - 30% අතර ප්‍රමාණයක වැඩි වීමක් විශ්‍රාමිකයන් වෙනුවෙන් ද අනුමත කර ඇත. එම නිසා මුල් කාලයේදී තදබල ගැටළු ඇති නො වීය. එහෙත් කාලයාගේ ඇවෑමෙන් 1986 දී පමණ 1985 ට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ගේ වැටුප් 1985 වර්ෂයට අදාළව ප්‍රතිශෝධනය කර ඇත.

එය එක්තරා අයුරකින් වර්තමාන රජයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් යාවත්කාලීන කිරීමට සමාන දෙයකි. විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීම යනු අතීතයේ යම් දිනෙක විශ්‍රාම ගිය සේවකයෙකු වර්තමානයේ නිශ්චිත දිනයක විශ්‍රාම ගිය ලෙස සලකා එම පදනම කල්පිතව ගණනය කර විශ්‍රාම වැටුප වැඩිකර ගෙවීමය. රජයේ සේවකයින් මෙන්ම රජයේ විශ්‍රාමිකයා ද එකම පවුලක කොටස් කරුවන් ලෙස සලකා ඔවුන්ද ආත්ම ගෞරවයක් ඇතිව ජීවත් විය යුතු බැවින් එම මානව ධර්මයට ගරු කිරීමක් වශයෙන් රජයේ ඇති බැඳීම හා වගකීම මෙම යාවත්කාලීන කිරීම තුළින් ප්‍රදර්ශනය කෙරේ.

1986 තරම් අතීතයේදී මහබැංකුව මෙම සාධනීය ක්‍රමවේදය ක්‍රියාත්මක කලා පමණක් නො ව අනාගතයේ දී ඇතිවන විෂමතාවලදීද මෙම ක්‍රමය අනුගමනය කළයුතු බවට නිර්දේශයන් ද සටහන් කර ඇත. **මෙම නිර්දේශ අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාත්මක කළා නම් වර්තමානයේ මහබැංකු විශ්‍රාමිකයින්ට මුහුණ පාන්නට සිදු වී ඇති ගැටළු ඇති නො වන්නට ඉඩ තිබිණි.**

කාලයාගේ ඇවෑමෙන් විශේෂයෙන්ම 1997 න් පසුව වසර තුනකට වරක් සිදු කරනු ලබන මහබැංකුවේ වැටුප් වැඩකිරීම්වලදී සමහර අවස්ථාවල විශ්‍රාමිකයින්ට ලැබුණෝ සේවකයින්ට ලැබුණු ප්‍රමාණයෙන් භාගයෙනුත් භාගයක් පමණි. මුල් කාලවලදී සේවකයාට මෙන්ම විශ්‍රාමිකයාද එකම පවුලක සාමාජිකයන් ලෙස සැලකුවද කල් යාමේදී විශ්‍රාමිකයා එම තත්ත්වයෙන් වෙනස් වී ගිය බවක් අප හට දැක ගන්නට ලැබුණි. 1986 නිර්දේශ කළ පරිදි සුදුසු අවස්ථාවල යාවත්කාලීන කිරීම් සිදු නොවීම නිසා කාලයාගේ අවෑමෙන් විශ්‍රාමිකයින් අතර ද විෂමතා ලියලන්ට විය. වසර 2000 මුල් දශකයේදී මෙම විෂමතාවයට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම ගිය අවුරුදු අනුව වර්ග කර එකිනෙකට වෙනස් ප්‍රතිශතයන්ගෙන් විශ්‍රාම වැටුප් වැඩි කරන ලදී. මුලදී කොටස් දෙකකට කඩා වෙන් කළද එම කැඩීම් "ඇමීබාවන්" මෙන් ක්‍රියාත්මක වීම නිසා 2015 වන විට විශ්‍රාමිකයන් කොටස් හතකට වෙන් කරනු ලැබීය. 2006,2009 සහ 2012 යන වර්ෂවල වැටුප් වැඩිවීම් වලදී සේවක වැටුප් වැඩිකල ප්‍රමාණයන්ගෙන් ඉතාමත් අඩු ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් වැඩි කිරීම නිසා පැවති විෂමතාවයන් තවත් ව්‍යාකූල විය. සේවකයන් හා විශ්‍රාමිකයන් අතර අදහාගත නොහැකි පරතරයක් නිර්මාණය වූ අතර විශ්‍රාමිකයන් අතර ද බරපතල විෂමතාවයක් මතු විය. මේ නිසා වසර 2015 වන විට විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගැටළුව ඉතාමත්ම අසතුටුදායක තත්වයකට පත් විය. එය තේරුම් ගැනීමට එක් උදාහරණයක් හොඳටම ප්‍රමාණවත්ය. **එනම් 1986 දී විශ්‍රාමගිය අධිපති තුමාට පමණක් දෙවැනි වන නියෝජ්‍ය අධිපතිතුමා 2015 දී ලබා ගත්තේ 2011 දී විශ්‍රාම ගිය සුළු සේවකයෙකුගේ විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපකි.**

වසර 2015 වනවිට මහබැංකු විශ්‍රාමිකයින් මෙන්ම රජයේ විශ්‍රාමිකයින් ද තීර්ණාත්මක විසදුමක් බලාපොරොත්තුවෙන් සිටි වකවානුවක් විය. මහබැංකුව මෙන් නොව රජය,

රාජ්‍යසේකයින්ගේ වැටුප් වැඩි කැරන අවස්ථාවේදීම විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කළත් සමහර විට අවුරුදුපතා ද එසේ නොමැති විටෙක අවුරුදු කීපයකට වරක් ද සිදුකරයි. නමුත් දෙපිරිසකට එකම අවස්ථාවේදී පිළියම් යොදනු ලබයි. ඒහෙත් ජීවන වියදම වැඩි වීමේ වේගය මත රජයේ සේවකයාට ලබාදෙන සහනයම විශ්‍රාමිකයාට ද ලබා දිය නොහැකි වූ බැවින් කාලයාගේ අවෑමෙන් සේවකයා ලබා ගන්නා වැටුපත් විශ්‍රාමිකයා ලබා ගන්නා විශ්‍රාම වැටුපත් අතර වෙනස පුළුල් වන්නට විය. **එම නිසා මහබැංකුව 1986 දී පමණ ක්‍රියාත්මක කර පසුව අමතක කර දැමූ යාවත්කාලීන කිරීමේ ක්‍රමය රජය ප්‍රතිපත්තියක් වශයෙන් දිගටම ක්‍රියාත්මක කළේය.** ඒ අනුව 2004 සහ 2006 වර්ෂවලදීත් යාවත්කාලීන කිරීම් දෙකක් තම විශ්‍රාමිකයන් වෙනුවෙන් හඳුන්වාදී තිබේ. මෙම ක්‍රමවේදය නිසා 2015 වන වට රජයේ විශ්‍රාමිකයින්ගේ ඉල්ලීම වූයේ ඔවුන්ගේ විශ්‍රාම වැටුප 2006 දක්වා යාවත්කාලීන කරන ලෙසය. රජයේ විශ්‍රාමිකයාට යාවත්කාලීන කිරීම විටින් විට සිදු කර තිබූ බැවින් මහබැංකු විශ්‍රාමිකයාට වඩා හොඳ තැනක රජයේ විශ්‍රාමිකයා සිටි බව පිළිගත යුතුය. **විශ්‍රාම ගිය දිසාපති වරයෙකුගේ විශ්‍රාම වැටුපට වඩා වැඩි විශ්‍රාම වැටුපක් කවරදාවත් කාර්යාලීය කාර්ය සහායකයෙකු ලබා ගත්තේ නැත.** 2015 පමණ වන විට මේ ගැටළුවේ බරපතළකම මහබැංකු පාලනාධිකාරයටද හොඳින් තේරුම් ගොස් තිබූ බැවින් සුදුසු විසඳුමක් යෝජනා කරන ලෙස විශ්‍රාමික සංගමයට දන්වා සිටින ලදී.

මෙය ඉතා දුෂ්කර කටයුත්තක් විය. සේවක කොටස් වලට සිදු කරනු ලබන වැටුප් වැඩිකිරීම් වලට සීමාවන් යෝජනා කිරීමට විශ්‍රාමික සංගමයට සදාචාරාත්මක අයිතියක් නො තිබූ බැවින් කළ හැකි එකම ක්‍රමය වූයේ විශ්‍රාමිකයන් අතරම විෂමතාවය නැති කිරීමට යෝජනා සකස් කිරීමය. ඒ අනුව 2006, 2009, 2012 ට අදාළව විශ්‍රාම වැටුප් වැඩි විය යුතු ප්‍රතිශතයන් දක්වා මෙම විෂමතාවයන් නැති කිරීම සඳහා 2012 දක්වා විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය විය යුතු බැවින් වසර 2012 දක්වා ඔවුන්ගේ වැටුප් ප්‍රතිශෝධනය කරන ලෙස ඉල්ලා සිටින ලදී. **2006 හෝ 2009 වර්ෂවලට විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමේදී සමස්ථ විශ්‍රාමිකයන්ගේ ම වැටුප් විෂමතාවයට විසඳුමක් නො ලැබෙන බැවින් 2012 දක්වා සංශෝධනය කරන ලෙසට ඉල්ලීමක් සිදු විය.**

නමුත් මහබැංකු පාලනාධිකාරය සංගමයේ යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කොට ඔවුන්ගේ විකල්ප යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. සංගමයේ නිරීක්ෂණ අනුව උද්ගතව තිබූ ගැටළුවට විසඳුමක් දිය හැකි ව තිබුණේ 2012 වසර දක්වා විෂමතා ඉවත් කිරීමෙන් පමණි. නමුත් පාලනාධිකාර යෝජනාව අනුව 2006 වසර පාදක කරගෙන ඉතාමත් සුළු අනුපාතික ක්‍රමයකට වැටුප් වැඩි කිරීම මගින් විසඳුමක් යෝජනා කර තිබුණි. ඒ අනුව 2006 දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ට පමණක් ක්‍රමයෙන් අඩු වී යන ප්‍රතිශත වැඩි කිරීමක් සහ ඊට අමතරව රුපියල් 3500 ක ස්ථාවර දීමනාවක්ද යෝජනා කර තිබුණි. මෙම රුපියල් 3500 දීමනාව 2006 ට පසුව විශ්‍රාම ගිය අයටද ලැබෙන සේ සකස් විය.

පසුව විශ්‍රාමික සංගමයේ ඉල්ලීම පරිදි තවත් සුළු ප්‍රතිශතාත්මක 2% ක සහ 1% ක වැඩි කිරීමක් 2006 සිට 2012 දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ට ලබා දෙන ලදී. **විශ්‍රාමික සංගමය කිසිදු විටෙක වැටුප් සංශෝධනය 2006 වර්ෂයෙන් නතර කරන ලෙස හා රුපියල් 3500 ක දීමනාවක් පාලනාධිකාරයෙන් ඉල්ලා තිබුණේ නැත. එම නිසා මෙම 2006 වර්ෂයත් රුපියල් 3500 ස්ථාවර දීමනාවක් පාලනාධිකාරයේ යෝජනාවට ඇතුල් වූයේ කෙසේද?**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සොයා ගැනීමට නම් අදාළ වකවානුව වන විට රජයේ විශ්‍රාමිකයින් වෙනුවෙන් ඉදිරිපත් කළ යාවත්කාලීන යෝජනාව පරිස්සමින් හැදෑරිය යුතුය. ඔවුනගේ ඉල්ලීම වූයේ තම විශ්‍රාම වැටුප 2006 වසර දක්වා යාවත්කාලීන කරන ලෙසය. මෙම ඉල්ලීමට සුභවාදී ප්‍රතිචාරයක් 2015 අයවැය ලේඛනය මගින් ලබා දී තිබූ අතර 2015-06-25 දින නිකුත් කරන ලද අංක 16/2015 චක්‍රලේඛනය මගින් ඊට අදාළ විසඳුම් ක්‍රියාවලියක් ඉදිරිපත් කර තිබුණි. මෙම චක්‍රලේඛනයට අනුව එවකට 1997 දක්වා යාවත්කාලීන කර තිබූ රජයේ විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප 2006 දක්වා යාවත්කාලීන කරන ලදී. ඊට අමතර වශයෙන් රජයේ සේවකයන්ට ලබා දුන් රුපියල් 5000 ක දීමනාවෙන් 70% ක ප්‍රමාණයක්ද එනම් රුපියල් 3500 ක් විශ්‍රාමිකයාගේ වැටුපට එකතු කරන ලදී. 2006 දක්වා විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමට අමතරව මෙවැනි රුපියල් 3500 ක දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීමට හේතු පාදක වූ කරුණ 2015 අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී කරන ලද පහත දැක්වෙන ප්‍රකාශවලින් පැහැදිළිය. එම ප්‍රකාශය පහත දක්වමු.

**"රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමේදී ඊට පෙර විශ්‍රාම ලැබුවන්ගේ වැටුප් අතර ඇති වන විෂමතාවය ඉවත් කිරීම සඳහා ඔවුන් ඉල්ලා ඇති 2006 වැටුප් පදනම මත නොව 2015 සඳහා මා යෝජනා කළ වැටුප් ව්‍යුහයටම ගලපමින් මුළුමනින්ම විසඳීමට ද යෝජනා කරනවා. මින්පසු විශ්‍රාම වැටුප් විෂමතාවයක් මේ නිසා ඇති නොවන අතර සියළු විශ්‍රාමික වැටුප් 2015 නව වැටුප් ව්‍යුහයට අනුකූලව සකස් කරනු ලබනවා."**

2015 අය - වැය ලේඛණය මගින් රජය විශ්‍රාමිකයාට දුන් පොරොන්දුව මත 2015.06.25 දිනැති අංක 16/2015 චක්‍රලේඛය මගින් රජයේ විශ්‍රාමික ගැටළුවට තිරසාර විසඳුමක් ලැබුණි. රජය විශ්‍රාමිකයාගේ වැටුප 2006 දක්වා යාවත්කාලීන කිරීමේදී එය සිදුවූයේ 2015 වර්ෂයේ බැවින් සැබැවින්ම විශ්‍රාමිකයාට ලැබුණේ ඊට අවුරුදු නවයකට කලින් එනම්, 2006 දී සේවකයාගේ ජීවන තත්වයට ගෙවූ ප්‍රමාණයයි. **එම නිසා 2006 -2015 අතර වැඩි වූ වියදම ගැන සලකා විශ්‍රාමිකයාට සාධාරණයක් ඉටු කිරීම සඳහා 2015 දී රජයේ සේවකයාට වැඩි කල රුපියල් 5000 ක දීමනාවෙන්**

**70% ක ප්‍රතිශතයක් එනම්ල රුපියල් 3500 ක දීමනාවක් අමතර වශයෙන් විශ්‍රාමිකයාට ගෙවන ලදී.** මහබැංකු විශ්‍රාමික සංගමය තම යෝජනා පාලනාධිකාරය වෙත ඉදිරිපත් කරන වකවානුවේදී මෙම රජයේ චක්‍රලේඛය නිකුත් වී තිබුණි. මහ බැංකුව මෙම චක්‍රලේඛයට නාමික අනුකූලතාවයක් දැක්වීම සඳහා 2006 වර්ෂය සහ රුපියල් 3500 ක දීමනාව යොදාගත් බව පැහැදිලිය.

මේ වන විට මැතිවරණයක් පැවැත්වීමට රට සූදානම් වූ බැවින් රජයේ සේවකයන්ගේ වැටුප් යාවත්කාලීන කිරීමක් සිදු වුවහොත් ඒ අනුව මහ බැංකුවේද විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමක් සිදු කරන බවට අධිපතිතුමා දුන් පොරොන්දුව මත පාලනාධිකාරය දුන් යෝජනාව පිළි ගැනීමට විශ්‍රාමික සංගමයට සිදු විය. පසුව 2006 වසරට අදාලව මහබැංකු විශ්‍රාමිකයන්ගේ ද විශ්‍රාම වැටුප් යාවත්කාලීන කරන ලද අතර එමගින් රජයේ ප්‍රතිපත්තියෙන් අඩක් පමණක් ක්‍රියාත්මක කරන ලදී. පැවති වාතාවරණය යටතේ මෙම අඩුපාඩුව සම්බන්ධයෙන් කටයුතු කිරීම මගහැරී ගොස් ඇත. **ඉතිහාසය හැදෑරිය යුත්තේ පාඩම් ඉගෙන ගැනීමට මිස ප්‍රතිවාදනය කිරීමට නොවන බැවින් මෙම අඩුපාඩුව ඉතිමහාසයටම සිර කර වර්තමානය නිවැරදි කර ගත යුතුව ඇත.**

මහබැංකුවේ මෙම යාවත්කාලීන ක්‍රියාවලිය රජයේ මෙන් අංග සම්පූර්ණ වැඩ පිළිවෙලක් නො වූ අතර රජය මෙන් විශ්‍රාම වැටුප් ගැටළුවට තිරසාර විසඳුමක් ලබා දුන්නේ නැත. එයට ප්‍රධාන හේතුව වූයේ රජයේ විශ්‍රාමිකයාට 2015 කාලයට අදාලව කරන ලද 70% අමතර වැඩි වීම මහ බැංකු විශ්‍රාමිකයාට ලබා නොදීමය. 2015 වර්ෂයේදී 2006 ට කලින් විශ්‍රාම ගිය මහබැංකු විශ්‍රාමිකයා 2006ට යාවත්කාලීන කළද 2009, 2012 සහ 2015 වැටුප් වැඩිවීම් වලට අදාලව ලැබිය යුතු ප්‍රමාණය නොලැබී ගියේය. **2012 ට පසුව විශ්‍රාම ගිය මහ බැංකු විශ්‍රාමිකයාට ලැබුණේ රජය රජයේ විශ්‍රාමිකයාට ලබා දුන් රුපියල් 3500 පමණකි.** එබැවින් 2006 ට යාවත්කාලීන කිරීම තුළින් රජය රජයේ විශ්‍රාමිකයාට ලබාදුන් තිරසාර විසඳුම මහබැංකුව තම විශ්‍රාමිකයාට ලබා නොදුන් බව එක් උදාහරණයක් පමණක් සලකා බැලීමෙන් වටහා ගත හැකිය. 2006 වසරට අදාලව මහබැංකුව සිදු කළ විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමෙන් පසුව එනම් 2009 ජනවාරි මස පළමු වන දිනට (2009 වැටුප් වැඩි කිරීමට පෙර) පෙර විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ මූලික විශ්‍රාම වැටුප මෙන් දෙගුණයකටත් වැඩි විශ්‍රාම වැටුපක් 2015 ජනවාරි මාසයෙන් පසුව විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිවරයෙකු ලබාගෙන ඇත. තවදුරටත් පැහැදිලි කළහොත් 2009 දී විශ්‍රාමගිය නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ මූලික වැටුප 2015 දී විශ්‍රාම ගිය මාණ්ඩලික පන්තියේ 1 ශ්‍රේණියේ විශ්‍රාමිකයෙකුගේ මූලික වැටුපට වඩා අඩු අගයක් ගත්තේය.

මහබැංකුව තුළ 2006 විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමෙන් පසුව ටික කලකින් මේ සා විශාල විෂමතාවයක් ඇතිවීම කුමන ආකාරයකින් හෝ සාධාරණීකරණය කළ නොහැක. මහබැංකුව විසින් ක්‍රියාත්මක කළ විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵලය නො ලැබී ඇති බැවින් රජය අනුමත කළ ක්‍රමවේදය නිවැරදිව අනුගමනය කිරීම කළ යුතුව ඇත. **රජයේ ප්‍රතිපත්තියේ බාහිර ස්වරූපය නොව එහි අන්තර්ගතය තුළ ඇති සාධාරණත්වය** වටහා ගැනීම ප්‍රඥාගෝචර බව පෙනේ. ලක්‍ෂ 8 කට වැඩි විශ්‍රාමික පිරිසකට රජය තිරසාර විසඳුම් ලබා දුන්නේ නම් 1500 කට ආසන්න මහබැංකුවේ සුළු පිරිසකට අදාලව තිරසාර විසඳුමක් ලබා දීමට නොහැකි වූයේ මන්ද? එම නිසා 2018 වැටුප් වැඩි වීමට අදාලව පහත දැක්වෙන සරළ යෝජනා දෙක ක්‍රියාත්මක කරන ලෙස විශ්‍රාමික සංගමය විසින් 2017. 11. 27 දිනැති ලිපියෙන් මහබැංකු අධිපති තුමා වෙත දන්වා යවා ඇත.

1. **වසර 2006 දක්වා දැනටමත් යාවත්කාලීන කරන ලද මහබැංකු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් 2015 වසරට යාවත්කාලීන කිරීම.**
2. **ඉදිරියේදී 2018 වසරට අදාල මහබැංකු සේවකයින්ට ලබා දෙන වැටුප් වැඩිවීම් වලින් 70% ක ප්‍රමාණයක් පංතිය ශ්‍රේණිය හා සේවා කාලය මත කල්පිතව ගණන් බලා එම ප්‍රමාණය විශ්‍රාමිකයින්ට ලබා දීම.**

අංක 1 යෝජනාව ඉදිරිපත් කරනු ලබන්නේ 2015 වර්සයේදී 2006 වර්ෂයට අදාලව විශ්‍රාම වැටුප් යාවත්කාලීන කිරීමේදී මහබැංකුව තුළ සිදු වූ වැරැද්ද නිවැරදි කිරීමටය.

අංක 2 යෝජනාව මගින් 70% ප්‍රතිශතයක් බලාපොරොත්තු වීම නිවැරදි පදනමක පිහිටා කරන ඉල්මකි. එය ජාතික වැටුප් කොමිසම මගින් අට ලක්‍ෂයක් පමණ වන රජයේ විශ්‍රාමිකයින්ගේ ගැටළුවට තිරසාර විසඳුමක් ලබා දීම සඳහා රජයේ සේවකයාත් රජයේ විශ්‍රාමිකයාත් අතර ඇති අවියෝජනීය සම්බන්ධතාවය හොඳින් සලකා බලා 2010 වර්ෂයේදී යෝජනා කළ 2015 වර්ෂයේ ක්‍රියාත්මක කළ රජයේ ප්‍රතිපත්තියට අනුකූලත්වය දැක්වීමකි. **රජයේ සේවකයින්ට 100 ක් ලබා දෙන විට විශ්‍රාමිකයන්ටද තම අත්මගෞරවය රැක ගැනීමට 70 ක් දිය යුතු බවට මෙම විශ්ව සාධාරණීය ක්‍රමය යෝජනා කලේ ජාතික වැටුප් කොමිසමයි.**

රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාධනීය ලක්ෂණ උකහා සකස් කර ගත් මහබැංකු විශ්‍රාම වැටුප් ක්‍රමයට ද මෙම හඳුන්වා දීම තුළින් මහබැංකු විශ්‍රාමියන්ගේ ගැටළුවට තිරසාර විසඳුමක් ලැබෙන බව අපාගේ විශ්විසයයි. වසර 3 න් 3 ට සාමූහික ගිවිසුම මගින් මහබැංකු සේවකයින්ගේ වැඩි කළ වැටුප් තීරණය වන විටම විශ්‍රාමිකයින්ට අයිති කොටස ද තීරණය වන බැවින් විනිවිධභාවයකින් සියල්ල සිදු වෙයි. එවිට අනාගතයේ වසර තුනෙන් තුනට විශ්‍රාම වැටුප් වැඩි කරන ලෙස ඉල්ලීමට සිද්ධ වන්නේ නැත.

මෙම යෝජනා දෙක ක්‍රියාත්මක කර ගැනීම සඳහා පාලනාධිකාරය සමඟ ඵලදායී සාකච්ඡාවක් පැවැත්වීමට පාදක කර ගත යුත්තේ 2006 වර්ෂයට මහබැංකු විශ්‍රාමිකයන්ගේ වැටුප් යාවත්කාලීන කරන ලද වැටුප් පදනමයි. 2015 වසරේ වැටුප් යාවත්කාලීන කිරීම කඩිමුඩියේ සිදු වූ නිසා අදාළ ක්‍රමවේදය එක් එක්

විශ්‍රාමිකයාට දැන්වීමට අවකාශයක් නොවීය. මෙම තොරතුරු මෙතෙක් නොලැබීම නිසා නොයෙකුත් දුර්මත පැතිරී ඇත. මෙම කාරණය ද ඉදිරියේදී විශ්‍රාම වැටුප් යාවත්කාලීන කර ගැනීමට අදාල කර ගත යුතු බැවින් ද එම ක්‍රමවේදය වැටුප් තල හා ශ්‍රේණි අනුව ලබා දෙන ලෙස විශ්‍රාමික සංගමය විසින් 2017.10.17 වන දින මහබැංකුවේ මානව සම්පත් අධ්‍යක්ෂකතුමා වෙත ලිපියක් යවන ලදී.

**මහබැංකුව සිය දෙවැනි මව ලෙස සලකන මහබැංකු විශ්‍රාමිකයාට මෙම වැටුප් තොරතරු තම උප්පැන්න සහතිකය තරමටම වැදගත්ය.**

ශ්‍රී ලංකාවේ උපදින පුද්ගලයෙකුගේ ජීවත්වීමට බලාපොරොත්තු තැබිය හැකි සාමාන්‍ය වයස් සීමාව අවුරුදු 72 ආසන්නයේ පවතී. නූතන වෛද්‍ය විද්‍යාවේ පිහිටෙන් අපගේ විශ්‍රාමිකයනට දීර්ඝායුෂ ලැබේවායි ප්‍රාර්ථනය කරමු. එහෙත් යථාර්තයට මුහුණ දිය යුතුය. වියපත් අයට වැළදෙන බෝ නොවන රෝග නිසා මිය යන විශ්‍රාමිකයින්ගේ ප්‍රමාණය මෑත කාලයේ වැඩි වෙමින් පවතී. එම නිසා දැනට අවුරුද්දකට වාර්ථා වන 40-60 අතර මිය යන ප්‍රමාණය ඉදිරියේදී තවත් වැඩි වීමට ඉඩ ඇත. එම නිසා ඉහත සඳහන් විශ්‍රාම වැටුප් වැඩි කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී අදාළ වියදම් වක්‍රය ආරම්භයේදී ඉක්මන් නැග්මක් වාර්ථා කළද වැඩිකල් නො ගොස් ක්‍රමයෙන් පහතට ඇදී 2035 වනවිට 0 අගයට සමාන වනු ඇත. එසේම 2009,1012, 2015 වර්ෂවලට අදාළව යම් ගෙවීම් ප්‍රමාණයක් දැනටමත් විශ්‍රාමිකයින්ට ගෙවා ඇති බැවින් ඔවුන්ට අදාලව ගෙවිය යුතු වන්නේ පරතරය පමණකි.

වැඩිහිටියනට සැලකීම, මහල්ලන්ට, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගරු කිරීම ගැන තම ප්‍රකාශන මගින් රටට උපදෙස් සපයන උගතුන්ගේ පාරාදීසයක් වන ශ්‍රී ලංකා මහබැංකුව වර්තමාන විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කිරීමට පුරෝගාමී වූ මෙන්ම 1968 සිදු වූ මහබැංකු ගින්න , 1971 කැරැල්ල සමයේ දැක්වූ උපරිම රාජ්‍ය පාක්ෂික භාවය හා 1996 බෝම්බ ප්‍රහාරයෙන් ඇදවැටෙන්නට නොදී කර ගසා කෙලින් කළ මේ වියපත් ගැහැණුන්ට හා මිනිසුන්ට තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම ඉටු කිරීම ඔවුන් මිය යන තෙක් කල් දැමිය යුතුද?

1986 තරම් ඈත අතීතයේදී ස්වකීයම නිර්දේශ නො සලකා හැරීමත් රජය තම ලක්ෂ සංඛ්‍යාත විශ්‍රාමිකයන්ගේ වැටුප් විටින් විට යාවත්කාලීන කිරීමෙන් දුන් ආදර්ශය හරයාත්මකව තේරුම් නො ගෙන රාජ්‍ය විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තිය විශ්‍රාමිකයාට නොව විශ්‍රාම යාමට සූදානම් වන්නාගේ වාසියට මග සැලසෙන අයුරින් අවභාවිත ලෙස යොදා ගැනීමත් 2015 රජය විශ්‍රාමිකයාගේ ප්‍රශ්නය විසදීමට දුන් තිරසාර විසදුම හිතුවක්කාර ලෙස වෙනස් කිරීමටත් "පුරුද්දක" ලබා දුන් පිරිසටම කාලයාගේ ඇවෑමෙන් තමාට එක් පෑන් පහරකින් ලබා දීමට හැකිව තිබූ එහෙත් නොදුන් සාධාරණය වෙනුවෙන් යැදීමට සිදු වීම දෛවයේ සරදමකි.

දෙවියන්ගේ හඬට සවන් නොදෙන ආඩම්බරකාර මිනිසුන් මහළු වයසට සපැමිණි කලට දෙවියන් විසින් ඥානය ලබා දෙන්නේ ඉන් ප්‍රයෝජන ගැනීමට නොව පසුතැවිල්ලෙන් දඬුවම් දීමට බව පැරණි ග්‍රීක නාට්‍යයක සඳහන්ව ඇත. එය අතීතයටත් එසේමය. වර්තමානයටත් එසේමය. අනාගතයටත් එසේමය.

**(මීලග විශ්‍රාම වැටුප් වැඩිකර ගැනීම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අදාලව විධායක කමිටුව තුල සාකච්ඡාවට හා විවාදයට භාජනය වූ කරුණු සැලකිල්ලට ගෙන බහුතර ඡන්දයෙන් සම්මත වූ යෝජනාවට පෙරවදනක් වශයෙන් මෙම ලියවිල්ල සකස් කරන ලද්දේ පොදු සාමාජිකත්වය දැනුවත් කිරීම සඳහාය.)**

## අපගෙන් වියෝ වූ සාමාජික සාමාජිකාවන්

1. කේ.සී.එම්. ගුණසේකර මහතා - 983
2. බෙනඩික් සිල්වා මහතා - 364
3. සෝමාවතී මුණසිංහ මහත්මිය (වැ.අ.ද.) - 65
4. පේමදාස ගමගේ මහතා - 3200
5. කේ.එම්. ත්‍යාගරාජා මහත්මිය (වැ.අ.ද.) - 10
6. එම්.එච්. ශේවියර් මහතා - 601
7. එම්.ඩී.ඩී.ඩබ්. ජයනෙත්ති මහත්මිය (වැ.අ.ද.)- 109
8. කේ.ඩී.එල්. ජිනරත්න මහතා - 941
9. ජේ.කේ. තිලකවංශ මහතා - 3709
10. වයි.ජී.කේ.ජී.එම්. මුනිදාස මහතා - 494
11. ජේ.එම්. පොඩිඅප්පුහාමි මහතා - 207
12. ටී. සෙල්වරත්නම් මහතා - 326

මෙම සාමාජික සාමාජිකාවන්ගේ පවුල් වලට අපගේ සාතිශය සංවේගය පල කරමු.

## OBITUARIES

1. Mr. K.C.M. Gunasekara - 983
2. Mr. Benedict Silva - 367
3. Mrs. S. Munasinghe (W & O.P) - 65
4. Mr. Pemadasa Gamage - 3200
5. Mrs. K.M. Thiyagaragah (W & O.P) - 10
6. Mr. A.M.M. Zavahir - 601
7. Mrs. M.D.D.W Jayaneththi (W & O.P) -109
8. K.D.L. Jinaratne - 941
9. Mr. J.K. Thilakawansa - 3709
10. Mr. Y.G.K.G.M. Munidasa - 494
11. Mr. J.M. Podiappuhami -207
12. Mr. T. Selwarathnam - 326

Our deepest Sympathies for their Families

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය

## Central Bank, Pensioners Association

**104/8, ස්ටැන්ලිතිලකරත්න මාවත, නුගේගොඩ.**

23.11.2017

Dr, Indrajith Coomarasamy
Governor,
Central Bank of Sri Lanka
Colombo 01.

Hon. Governor,

**Increasing the pensions of Central Bank Pensioners in the year 2018**

1. Salary increases are being implemented in the Central Bank of Sri Lanka once in 3 years. Accordingly, the last salary increase was in the year 2015 and the next increase is scheduled to be in the year 2018. According to the tradition which prevailed up to now, pensions of the Central Bank pensioners were also increased parallel to it.
2. In the year 2015, there was a change in the methodology of increasing pensions. Accordingly, instead of the irregular, non transparent percentage increase of pension scheme which was implemented till then, a system of up-dating pensions based on a specific day was introduced. All Central Bank pensioners were happy about this change, for which the credit should be given to the governor and staff of the Central Bank. According to this new process, pensions have been paid to all pensioners who retired prior to 2006, by up-dating pension to the year 2006. Salary increase similarly minor increases were also granted to those who retired after the year 2006. However, when compared with the salary increases made in the years 2009, 2012 and 2015, justice has been denied to the Central Bank pensioners. When an employee of the Central Bank gets a salary based on the living standard applicable to the relevant year, a Central Bank pensioner gets a pension based on the living stranded relevant to 9 years earlier.
3. Innocent men and women, who have rendered commendable service in the past, whilst enjoying limited privileges and who have rendered invaluable service, without allowing the Central Bank to collapse by the bomb attack in 1996, some of them may be spending at present the last few years of their lives. For some it could be few years, for some may be few months in for some few days.

Under the present yahapalana framework, which has provided a lasting solution for the problems of the Government pensioners, it would be natural to follow same positive policies in respect of the Central Bank of Sri Lanka also, which is a reputed organization affiliated to the Government. In an era like the present, when lasting solutions are being found for the problems of the country, we hope that the Central Bank would do its utmost to find solutions for the problems of its pensioners. If granting of some relief to these senior citizens to protect their self respect and dignity which were given to them by the Central Bank itself, is evaded or delayed, it would be considered as an unpardonable offence. Hence, we wish to invite your kind attention to the following proposal relevant to the 2018 pension increases.

**Proposals :**

1. Pensions of Central Bank pensioners, which have already been up – dated up to the year 2006, be up – dated to the year 2015.
2. A quantum of 70% of the salary increases to be given in 2018 to the Central Bank employees be given to its pensioners also, after hypothetical calculations based on class, grade and period of service
3. Discussions on welfare services.

Thanking you,
Yours faithfully,
Secretary
Central Bank Pensioners's Association
(By order of the Executive Committee)

# විශ්‍රාමික සංගමයේ මුතුකුඩය යටට සපැමිණි සැවොම වෙත සාදරයෙනි......

අපගේ 2017 අප්‍රේල් - ජුනි "සැදෑව" කලාපයෙන් මෙතෙක් විශ්‍රාමික සංගමයේ සාමාජිකත්වය ලබා නොමැති හා දායකත්ව මරණාධාර ක්‍රමයට ලියාපදිංචි වී නොමැති සියළුම සාමාජිකයනට විවෘත ආරාධනාවක් කර ඇත. අතිරේක වියහියදම් ගැන නොසලකා අපට සොයා ගත හැකි වූ සංගමයට මෙතෙක් පා නොතැබූ සියලුම විශ්‍රාමිකයින් වෙත මෙම සඟරාවේ පිටපත් යවා ඇත.

මෙම ලියවිල්ල ලියන දිනයේදීත් නව ඉල්ලුම්පත් ලැබී තිබූ බැවින් සංගමයේ ඉල්ලීමට දිරිගන්වන තුරු ප්‍රතිචාරයක් ලැබෙමින් පවතින බව සතුටින් දන්වා සිටිමු.

**සංගමයේ දායකත්ව මරණාධාර ක්‍රමය -**

2017 දෙසැම්බර් මාසය අවසාන වනවිට මෙම මරණාධාර ක්‍රමයේ සාමාජිකත්වය 644 දක්වා වර්ධනය වී ඇත. අප සංගමයේ සාමාජික සංඛ්‍යාව 1130 වන අතර ඉන් මෙම ක්‍රමයට ලියාපදිංචි වී ඇත්තේ 644 එනම් 57% පමණය. සාමාන්‍යයෙන් අවුරුදු 70 ඉක්මවූවන් මරණාධාර ක්‍රමවලට බඳවා ගන්නේ නැත. නමුත් අපගේ හිතවතුන්ට දක්වන විශේෂ අනුග්‍රහයක් වශයෙන් 2017 දෙසැම්බර් මස අවසානය තෙක් යම් සහනයක් සලසන ලදී. ඒ අනුව,

1. දැනටමත් සංගමයේ සාමාජිකයින් වී සිටින එහෙත් දායකත්ව මරණාධාර ක්‍රමයට ලියාපදිංචි වී නොමැති සියළුම සාමාජිකයින්ට වයස පිළිබඳ සීමා නොතකා මෙම ක්‍රමයට බැඳීමට අවස්ථාව ලබාදී ඇත.
2. මෙතෙක් සංගමයේ සාමාජිකත්වය ලබා නොමැති වයස අවුරුදු 70 නොඉක්මවන අයට ප්‍රමාද ගාස්තු ගෙවීමකින් තොරව දායකත්ව මරණාධාර ක්‍රමයේ සාමාජිකත්වය ලබා දී ඇත.
3. වයස අවුරුදු 70 ඉක්මවන අළුතින් සංගමයට බඳවාගත් සාමාජිකයන්ටද රුපියල් 10000 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමෙන් පසුව දායකත්ව මරණාධාර ක්‍රමයට බඳවා ගෙන ඇත.
4. සංගමයේ මරණාධාර ක්‍රමවලින් වරප්‍රසාද ලබාගැනීමට අවුරුද්දක කාල සීමාවක් නොකඩවා සියළුම සාමාජික මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවා තිබිය යුතුමය.

**සහන කාලය අවසන් වී ඇති බැවින් මින් ඉදිරියට වයස 70ට වැඩි කිසිම සාමාජිකයෙකු මෙම දායකත්ව මරණාධාර ක්‍රමයට බඳවා ගැනීම සිදුනොවනු ඇත.** මෙම අරමුදලේ පැවැත්ම තහවුරු කිරීම සඳහාත් සාමාජිකයින්ට වැඩි වරප්‍රසාද ලබාදීමටත් මෙම දායකත්ව මරණාධාර ක්‍රමය අරභයා විශේෂ යෝජනා කීපයක් මීළඟ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට විධායක කමිටුවේ අවධානය යොමු වී ඇත.

**සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම.**

දෙව්රම් වෙහෙරට ගොස් බුදු හාමුදුරුවන්ගෙන් බණ ඇසුවත් මාර්ග ඵල නො ලබා තවමත් සසරේ සැරි සරන අය ඕනෑ තරම් සිටිති. විශ්‍රාමික සංගමයට නොබැඳෙන අයත් ඕනෑ තරම් සිටින්නට පිළිවන. විශ්‍රාම යන විට අත මිට සරු වන බැවින්ද තවත් "අතිරේක රාජකාරිවල" නිරත වීමට සිදුවන බැවින්ද බොහෝ දෙනෙකුට සංගමය ගැන තැකීමක් නැත. ''ලැබෙන දෙයක් අපටත් ලැබේවි.'' යන සිතුවිල්ලෙන් වගේ වගක් නැතිව සිටින අයත් එමටය.

2017 දෙසැම්බර් මාසය තුළ 74 දෙනෙක් සාමාජිකත්වය ලබා ගත් නිසා අපගේ සාමාජික සංඛ්‍යාව 1130 දක්වා ඉහළ ගොස් ඇත. තවත් අයදුම්පත් රාශියක් ලැබී ඇති අතර 2018 ජනවාරි සහ පෙබරවාරි මාස වලදී එම අයට සාමාජිකත්වය පිරිනමනු ඇත. **විශ්‍රාමික සංගමය මහබැංකුව ආශ්‍රිතව ඇති විශාලතම සංවිධානයයි.** විවිධ නිලතල දැරුවන් සාමාජිකත්වය ලබා ඇති බැවින් දැනුමෙන් පිරිපුන්ය. 1965 දී ආරම්භ වී 1997 දී ඈවර කළ මහබැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය දැන පවතින්නේ ''බල'' දශකයේය. අටලෝදහම අනුව වසර 2035 පමණ වනවිට ''සයන'' දශකයට පැමිණ ශුන්‍ය වීමට නියමිතය. එමනිසා විශ්‍රාමික සංගමයේ සාමාජිකයින්ගේ අනාගත සුභ සිද්ධිය උදෙසා ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඒවා ස්ථාවර කර තිබීම වැදගත්ය. සංගමයේ ක්‍රියා මාර්ගය කොටස් පහකට බෙදිය හැකිය.

**සංගමයේ ඉලක්ක**

1. තිරසාර ප්‍රතිපත්තියක් යටතේ විනිවිදභාවයෙන් යුතුව අනාගත විශ්‍රාම වැටුප් යාවත්කාලීන කරගැනීම.
2. මහබැංකුව ආශ්‍රිතව පවතින මරණාධාර ක්‍රම වලින් සාමාජිකත්වයට උපරිම ප්‍රයෝජන ලබාදීම්
3. එකිනෙකා හමුවීමට සලස්වා විශ්‍රාමිකයින්ගේ මනස සුවපත් කිරීම.
4. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය විශ්‍රාමිකයාට පහසුවක් සැලසෙන පරිදි කාලයත් සමඟ ගලපා ගැනීම සහ එමගින් ජීවිතයේ අවසාන කාලයේ පෞද්ගලික වෛද්‍ය සේවාවේ ගොදුරක් බවට පත් වීම වළක්වා ගැනීම.
5. මහ බැංකු ඉතිහාසය තුළ දුෂ්කර ඉලක්ක ජයගත් ජ්‍යේෂ්ඨයින් මහ බැංකුවේ වර්තමාන රාහු අපලය දුරු කර ගැනීම සඳහා ඒකරාශී කිරීම සහ අවදියෙන් තබා ගැනීම.

**අඳුරින් එළියට**

නමුත් වර්තමානයේ තත්වය කණගාටුදායක ය. විශ්‍රාමික සංගමයේ නායකයින්ගේ නිළ කාලයෙන් වැඩි ප්‍රමාණයක් වැය වන්නේ නිසි ප්‍රතිපත්තියක් නොමැති විශ්‍රාම වැටුප් වැඩිකර ගැනීමේ අරගලය සමඟ ඔට්ටු වීමටය. උගත් බුද්ධිමත් බහුශ්‍රැතයින්ගේ පාරාදීසයක් වී ඇති මහ බැංකුවට තම විශ්‍රාමිකයන් සඳහා තිරසාර වැටුප් ප්‍රතිපත්තියක් සකස් කර ගැනිමට තවමත් අපොහොසත් වී ඇත. එම නිසා මෙම කාරණය මහ බැංකුවේ ආචාර ධර්ම පද්ධතියට ඇතුලත් විය යුතුමය. ඒ අර්ථයෙන් රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය අපට වඩා ඉදිරියෙන් සිටී. විධායක කමිටුවේ වර්තමාන කාර්ය භාරය වී ඇත්තේ මෙම ප්‍රතිපත්තිය සකස් කර ගැනිමටය. මෙම ප්‍රතිපත්තිමය අරගලයේදී දැනට විශ්‍රාම ගොස් සිටින අයවලුන් මෙන්ම අනාගතයේදී විශ්‍රාම යාමට නියමිත එහෙත් මෙම ප්‍රතිපත්තිය සකස් කර ගැනීමේදී ඊට එරෙහි වන්නන්ගේ ද අනාගත සුභසිද්ධිය තකා ඉවසිල්ලෙන් කටයුතු කිරීමට සිදු වීම පුදුම සරදමකි. තව අවුරුදු 10 කින් හෝ 15 කින් විශ්‍රාමික සංගමයේ සාමාජික සංඛ්‍යාව හීන වී ඒ නිසා හඬද ශක්තියද දුබලව ගොස් පවතින විශ්‍රාම වැටුප් ක්‍රමය ගැන නිනවුවක් නැති තීරකයන් පිරිසක් හමුවේ අසරණ වන්නේ වර්තමානයේ අපගේ ප්‍රතිපත්තිමය අරගලයට අකුල් හෙළන එදාට සුළු පිරිසක් වන අයවලුන් වීමද කදිම සරදමකි.

වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය ගැනද කිව යුත්තේ මේ ටිකමය. මහබැංකුව තුළ සේවාව කරන යුගයේ හෙම්බිරිස්සාවක්වත් නො සෑදුන, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ කිසිම ගෙවීමක් ලබා නොගත් විශ්‍රාම ගිය පසු ප්‍රතිලාභ ක්‍රමයේ සියල්ල වියදම් කර අවසානයේ එම වියදම් පියවා ගැනීමට බැරිව අසරණ වන විශ්‍රාමිකයන් අප ඕනෑ තරම් දැක ඇත. මහබැංකුව නිසා පෞද්ගලික වෛද්‍ය පහසුකම්වලට හුරුපුරුදු වූ මහබැංකු විශ්‍රාමකයිනට නිදහස් සෞඛ්‍ය සේවාවට අනුගත වීම බෙහෙවින් පීඩාකාරී අත්දැකීමකි. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය කාලානුරූපව යාවත්කාලීන කර ගැනීම සඳහා කරනු ලබන ප්‍රතිපත්තිමය අරගලයේදීද ගැටීමට සිදුවන්නේ අනාගතයේදී එසේ අයසට පත්වන වර්තමානයේ එවැන්නක් සිදු නොවේයැයි සිතන අය සමඟය.

එම නිසා සක්‍රීයව දායකවී හැකි අවස්ථාවලදී තම යුතුකම් ඉටු කිරීම ඉතා උතුම් ක්‍රියාවකි. ඒ අර්ථයෙන් මෙම නව සාමාජිකයන් අපට මසුරන් වටිනවාය. එනිසාම නව සාමාජික නාමලේඛනය පහත දක්වන්නේ සතුටු සිතිනි.

1. 442 පී. ගුණසේකර
2. 720 ඩී.බී. නියංගොඩ
3. 840 පී. ඒ. ධනපාල
4. 890 ඩී. එල්.එල්. සරත්චන්ද්‍ර
5. 910 එස්. ගුණරත්න
6. 942 ආර්.පී. කෝදාගොඩ
7. 992 එච්.එම්. සමරවික්‍රම
8. 993 පී.ඩී.පී.එම්. ෂෙල්ටන්
9. 1009 එල්.එන්.පී. ගුණපාල
10. 1015 එම්.සී. ඩී. සිල්වා
11. 1040 එච්.ඩී. තිසේරා
12. 1055 ආර්.සී. විජේතිලක
13. 1062 පී.එල්ලාවල
14. 1073 පී. කරුණාදාස
15. 1079 බී.ඒ.එස්. නන්දසිරි
16. 1080 එස්.ඒ.සී. පෙරේරා
17. 1084 එස්.එස්.ඒ. ගුණරත්න
18. 1095 එස්. කුමාරසිංහ
19. 1105 ආර්.එල්.ඩී.එම්.ආර්. හෙන්ඩ්‍රික්ස්
20. 1137 කේ. බාලසුබ්‍රමනියම්
21. 1158 එම්.ඩී. අකුරුගොඩගමගේ
22. 1177 ජී.ඩී. ගුණරත්න
23. 1219 කේ.ජී.එස්. ද සිල්වා
24. 1247 එස්.එම්. ගමගේ
25. 1293 එච්.එම්.එස්. අබේකෝන්
26. 1319 එච්.එම්. හේරත් බණ්ඩා
27. 1348 ජී. ප්‍රේමදාස
28. 1361 එච්.එම්. රත්නායක
29. 1399 ඒ.එච්.එම්. නවුෆර්
30. 1402 ඩී.වී.ඩී.එස්. රාජකරුණා
31. 1405 එල්. ජයවීර
32. 1428 එච්. ශ්‍රියාරත්න
33. 1441 කේ.ජී.ඒ.ඒ. ගුණරත්න
34. 1443 එම්.කේ.කේ. නන්දසිරි
35. 1453 ඩී.එම්.ටී. දසනායක
36. 1460 ඩබ්.එස්.ඩබ්. පෙරේරා
37. 1483 බී.කේ.එස්.සී. කුමාර
38. 1516 ජී.ඩබ්.අයි. පෙරේරා
39. 1520 ඒ.පී.ඒ.එස්. ජයරත්න
40. 1521 ඩබ්.එම්.චන්ද්‍රසේකර බණ්ඩා
41. 1522 ඩබ්.එල්. ගුණසේන
42. 1528 අයි.එම්. හොරගල
43. 1546 පී.වී.එස්.එච්.අයි. කුරේරා
44. 1547 ඩී. ජයවර්ධන
45. 1549 ජී. ධර්මසේන
46. 1551 ඩබ්.එම්.කේ. වීරකෝන්
47. 1552 එම්.ඩී.ජී. රණසිංහ
48. 1565 ඩබ්.ඒ.එස්.පී.අයි.ඒ. ජයවර්ධන
49. 3041 ඩබ්.ඒ. සිරිසේන
50. 3081 එච්.ඊ. කරුණාදාස
51. 3095 ඩබ්.කේ.පී.අයි. වීරසේකර
52. 3103 ඩබ්.ඒ. සෝමපාල
53. 3129 ඊ.එම්.සී.ඩබ්. ඒකනායක
54. 3141 ආර්. අකුරුගොඩගමගේ
55. 3195 එස්.එම්.එස්.ඒ. බණ්ඩාර
56. 3212 කේ.ඩී.ඩබ්. බොතේජු
57. 3215 සී. ගුණතිලක
58. 3226 ඩබ්.එම්.එම්.පෙරේරා
59. 3248 එස්. වීරසේකර
60. 3250 කේ.ජී.එන්. ගුණරත්න
61. 3254 අයි. සෝමසිරි
62. 3317 ආර්.එම්. විජේරත්න
63. 3372 එම්.ඒ. කරුණාරත්න
64. 3395 ඩබ්.පී.එල්.සී. පෙරේරා
65. 3481 කේ.ජී.එස්. රූපරත්න
66. 3519 කේ.පී.ඊ.කේ. ජයරත්න
67. 3520 එම්.සී.එස්. මාරසිංහ
68. 3543 කේ.ඩී.ජී. ඩික්සන්
69. 3593 ඩබ්.එච්.ඒ. කොස්තා
70. 3625 බී.එම්. ලීලාවතී
71. 3668 කේ.පී.එච්. උඩගිලිය
72. 3727 ඩබ්.ඒ. තිස්ස
73. 3728 එම්.එස්.එම්. සිල්වා
74. 3734 කේ.පී. ද සිල්වා

# පුංචි ළිඳේ වතුර රසයි

නිවසක් සාදන්නට කලින් නැකැත් බලා ළිඳක් කැපීම චිරාගත සම්ප්‍රදායකි. එහෙත් ඇතැම්හු කාලයත් සමඟ ඉදිරියට යාමට උනන්දුවීම නිසා විදුලිය සහ නළ ජල පහසුකම් ලබාගත් පසු කප්පියක් දමා තිබූ ළිඳට ආයුබෝවන් කීහ. භූමි අලංකරණයට නොගැලපුණු නිසා පවස නිවූ ළිඳ කුණු කසල දමා ගොඩකර ගස්ලබු පැලයක් සිටුවති. එහෙත් වැඩ වර්ජන නිසා හෝ දීර්ඝ කාලීන විදුලිය කප්පාදු කිරීම් වලදී ඉඩෝරයේ දී සතුන් දිය සොයා යන්නේ යම්සේද සතර අත ඉගිල යන්නට සිදුවෙයි. ගෙදර වාහනයේ ජ්ලාස්ටික් බූලියක් පටවාගෙන ගිය හැකි නිසා එතරම් ලොකු අවුලක් සිදුවූයේ නැත. නමුත් සියල්ලන්ටම එසේ ඉගිල යන්නට සිදු වූයේ නැත. ගෙවතු ළිඳ වසා දැම්මේ නැති නිසාය. සමහරු භූමි අලංකරණයට ගැලපෙන පරිදි ළිඳ හැඩ ගන්වා නළ ජලයත් ළිං ජලයත් සම සමව පාවිච්චියට ගත්හ. විදුලි හෝ නළජල කප්පාදුව ඔවුනට බලපෑවේ නැත. පවස නිවාගත් ළිඳ කුණු දමා ගොඩකර නළ ජලයෙන් ස්වයංපෝෂණය වූ කාලයත් සමඟ ඉදිරියට ගිය ඉස්සරහ ගෙදර යාළුවාටද දිය පොදක් දීමට ඔහුට හැකිවිය. අපට මේ සිදුවීම් පෙළ මතකයට ආවේ රාජගිරියේ පිහිටි මහබැංකුවට අයත් පුංචි අච්චු කන්තෝරුව දැක බලා ගන්නට ගිය විටෙක දීය.

වසර 1987 දී පමණ ආසියානු සංවර්ධන බැංකුවේ මැදිහත්වීමෙන් (A.D.B.) මහබැංකුවට කුඩා මුද්‍රණ යන්ත්‍රයක් ලැබුණි. එකල මහබැංකු අධිපතිවරයා වූයේ අභාවප්‍රාප්ත ආචාර්ය වර්ණසේන රාසපුත්‍රම් මහතාය. මුද්‍රණ යන්ත්‍රය දැන් විදුපියස නමින් හඳුන්වනු ලබන රාජගිරියේ පිහිටි මහබැංකු පරිශ්‍රයේ බිම් මහලේ සවි කරනු ලැබීය. එය කුඩා වුවත් එකල පැවැති දියුණු තාක්ෂණයට අනුව ජර්මනියේ නිෂ්පාදිත GTOHEIDLBURG-GTO වර්ගයේ OFFCET මුද්‍රණ යන්ත්‍රයක් විය. මීට අමතරව දැතේ වීර්යෙන් කොළ කපන යන්ත්‍රයක්ද ලැබිණි. මෙම යුගයේදී මහබැංකුවේ මුද්‍රණ කටයුතු බාහිර ආයතන හරහා සිදු වූ බැවින් මුද්‍රණ ශිල්පය පිළිබඳ කිසිදු පරිචයක් අපට තිබුණේ නැත. මුද්‍රණ යන්ත්‍රය සවි කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා එකල රාජගිරියේ මහබැංකු මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයයේ සේවාව කල, පවරන කිසිදු රාජකාරියක් මගහැර නොයන, මහබැංකුවට පා තබන විට හැඳ සිටි ජාතික ඇඳුම කිසිදිනෙක වෙනස් නොකළ, මුනිවර ගති පැවතුම් වලින් හෙබි, 1996 යේ බෝම්බ ප්‍රහාරයෙන් අපට අහිමි වූ එස්. ඒ. කරුණාරත්න මහතාට පැවරුණි. ඔහු නිහඬව පැවරූ රාජකාරිය නිම කොට මුද්‍රණාලය මහබැංකුවේ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයට නොව සංනිවේදන දෙපාර්තමේන්තුවට අයත් විය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කළේය.

වසර 1988 දී මුද්‍රණාලයය පවත්වා ගැනීම සඳහා මාණ්ඩලිකනොවන ශ්‍රේණියේ දෑවුරුදු තාවකාලික පත්වීම් දෙකක් වශයෙන් මුද්‍රණ සහායකයෙකු සහ ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකු බඳවා ගන්නා ලදී. ඔවුන් දෙදෙනාගේ සේවය තාවකාලික වූයේ නැත. ඔවුන් දෙදෙනා අප්‍රමාණ අත්දැකීම් ලබා තවමත් මහබැංකු සේවාවේ යෙදී සිටිති. මුද්‍රණාලය භාරව කටයුතු කිරීම සඳහා එවකට මාණ්ඩලික සහකාර ශ්‍රේණියේ සේවාව කළ කලා උපාධිධාරියෙකු වූ අභාවප්‍රාප්ත මහින්ද මාකලන්ද මහතා පත් කෙරිණි. මාකලන්ද මහතා දුෂ්කර ඉලක්ක හඹා යාමට කැමැත්ත දක්වන්නෙකි. අවශ්‍ය පුහුණුව නොයෙක් තැන්වලින් ලබාගෙන ඔහු තම රාජකාරිය අකුරටම ඉටු කරන ලදී. වෙනත් දෙපාර්තමේන්තුවල සේවය කළ පොත් බඳින්නන් කීපදෙනෙකුද කටු සහ මිටි රැගෙන මුද්‍රණාලයයේ සේවාවට පැමිණියහ. ආරම්භ යුගයේදී "සටහන" සඟරාවක් මහබැංකු දෙපාර්තමේන්තුවල ආකෘතිපත්‍ර සහ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමත් ඊට අමතරව විධායක නිලධාරීන්ගේ නාමපත්‍ර මුද්‍රණය කිරීමත් නොකඩවාම සිදු කරනු ලැබීය.

සාම්ප්‍රදායානුකූලව මහබැංකු වාර්ෂික වාර්තාව සෑම අවුරුද්දේම අප්‍රේල් මාසය තුලදී මුදල් ඇමතිවරයාට භාරදිය යුතුය. මුද්‍රණ කටයුතු සිදු කෙරුණේ බාහිර මුද්‍රණාල හරහාය.1988 මාර්තු මාසය වනවිට මහබැංකු වාර්තාවේ සෝදුපත් බලාඑහි කටයුතු නිම කිරීමට සුදානම් කර තිබුණි. නමුත් මුද්‍රණ කරුවන්ගේ දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් දියත් වීම නිසා මහබැංකු වාර්තාව නියමිත දිනට මුද්‍රණය කිරීම අපහසු බව මුද්‍රණ හිමියන් මහබැංකුවට දන්වා සිටින ලදී. නමුත් 1988 අප්‍රේල් මාසය වනවිට වාර්ෂික වාර්තාවේ සිංහල පිටපත් අවම වශයෙන් 500 ක් හෝ අවශ්‍ය බව මහබැංකුව දැන සිටියේය.

මෙම අවස්ථාවේ නියමු මට්ටමකින් මුද්‍රණ කටයුතුවල නිරත වූ අපේ පුංචි මුද්‍රණාලයට වාර්ෂික වාර්තාවේ සිංහල පිටපත් 500 මුද්‍රණය කිරීමේ වගකීම භාරදෙන ලදී. වාර්ෂික වාර්තාව නිම කිරීමට ඉතිරිව තිබුණේ මුද්‍රණය කිරීම පමණක් වුවද එය භාරදූර කාර්යයක් විය. නමුත් දෑතෙ ඇඟිලි සංඛ්‍යාවට අඩු වූ සේවක පිරිස තම ආයතනය වෙනුවෙන් අභියෝගය භාර ගත්තේය. එහෙත් එය බෙහෙවින් වෙහෙසකර වූ රාජකාරියක් විය. මෙම කුඩා පිරිස 1988 සිංහල අළුත් අවුරුද්ද සමරන ලද්දේ තම නිවසින් ඈත් වී රාජගිරියේ බිම් මහලේ සිට මජන් නා ගත් දෑත් වලිනි. පොත් 500 ක් මුද්‍රණය කිරීමේ ඉලක්කය ජය ගත්තද සමහර සේවකයින්ට ඉන් පසු වැළඳුනු රෝග නිසා ආරෝග්‍ය ශාලා ගතවීමට සිදුවිය. **කෙසේවෙතත් තමනට අයිති මුද්‍රණාලයක ඇති වටිනාකම පිළිබඳව යම් හැඟීමක් මෙම ඇබැද්දිය නිසා මහබැංකුවට දැනෙන්නට ඇත.**

වසර 1988 ජුනි මාසය වනවිට ආචාර්ය වර්ණසේන රාසපුත්‍රම් (අභාවප්‍රාප්ත) මහතා වෙනුවට ආචාර්ය නෙවිල් කරුණාතිලක (අභාවප්‍රාප්ත) මහතා මහබැංකු අධිපති ධූරයට පත්විය. නෙවිල් කරුණාතිලක මහතා යුධ සෙනෙවියෙකු මෙන් යුහුව තීරණ ගැනීමට උපන්

හපන්කමක් තිබූ විරල ගණයේ නායකයෙකු විය. අධිපති ධූරයට පත්වන නොබෝ දිනෙකින්ම ඔහු රාජගිරිය මහබැංකු පරිශ්‍රයේ බිම්මහලට කඩා වැදී මුද්‍රණ යන්ත්‍ර අතරේ සැරිසරන්නට විය. අස්සක් මුල්ලක් නෑර පීරා බැලූ අධිපතිවරයා මුද්‍රණාලය කාලයට ගැලපෙන පරිදි වැඩි දියුණු කිරීමට අවශ්‍ය සියළු පියවර කඩිනමින් ක්‍රියාත්මක කළේය. කටු, මිටි උපයෝගී කරගෙන පොත් බැඳීම් කළ පොත් බඳින්නන්ට විහිළුවක් කර ඒවා කුණු කූඩයට දමා අළුත් පොත් මහන යන්ත්‍රයට හුරුපුරුදු වන ලෙස දන්වා සිටියේය. තවත් මුද්‍රණ යන්ත්‍ර දෙකක් සහ පොත් බැඳුම් කරන යන්ත්‍රයක් ද මිලදී ගැනිණ. සේවක සංඛ්‍යාවද වැඩි කළේය. මුද්‍රණාලයට නව කළමනාකරුවෙකුද පත් කළේය. ඔහු තෝරා ගන්නා ලද්දේ විධිමත් පරීක්ෂණයකිනි. 1989 අගෝස්තු පළමුවනදා **එම්. වී. කරුණාතිලක මහතා** පළමු මුද්‍රණ කළමනාකරු වශයෙන් පත් කෙරුණි. ඔහු තම සේවාව මැනවින් ඉටුකොට මහබැංකු පුංචි මුද්‍රණාලයේ පළමු මෙන්ම අවසාන කළමනාකරු වශයෙන් 1915 මැයි මාසයේ විශ්‍රාම ගියේය.

මෙම කාලය වනවිට මහබැංකු මුද්‍රණාලය මහබැංකුවේ මුද්‍රණ කටයුතු වලින් වැඩි ප්‍රමාණයක් සඳහා තම දායකත්වය ලබා දුන්නේය. විශේෂයෙන්ම රටේ ආර්ථිකය ගැන උනන්දු වන පාඨකයින් වන විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්, පාසල් ගුරුවරුන් සහ පාසල් දැර දැරියන්ට අඩු මිලකට පොත්පත් සහ වාර සඟරා මහබැංකුවට නිකුත් කළ හැකි වූයේ අපේ පුංචි මුද්‍රණාලය නිසාය.

වසර 1988 දී මහබැංකු වාර්ෂික වාර්තාව නිසි කලට නිකුත් කිරීමට අපේ පුංචි මුද්‍රණාලය උර දුන්නා සේම 1996 බෝම්බ ප්‍රහාරයේදී ඇද වැටෙන්නට ගිය මහබැංකුව කෙළින් කර ගැනීමටද උදව් දුන්නේය. මහබැංකුව ඇතැම් දෙපාර්තමේන්තු රාජගිරිය පරිශ්‍රයේ ආලින්දවල පවා සරණාගතයන් ලෙස සිට තම රාජකාරිවල යෙදුණේය. ඔවුන්ට අවශ්‍ය සියළුම ආකෘතිපත්‍ර ඉක්මනින් සැපයීමට මුද්‍රණ සේවකයෝ දිවා රෑ නො තකා සේවාවේ යෙදුණහ. මුද්‍රණාලය තිබූ බිම් මහලේ තැනින් තැන මෙම ආකෘති පත්‍ර තැන්පත් කර තිබීම එකල සුලභ දර්ශනයක් විය. **මහබැංකුවට අවශ්‍ය රහස් ලියකියවිලිවල රහස්‍යභාවය අකුරටම රැකුණේ මෙම පුංචි මුද්‍රණාලය නිසාය.** ඇතැම් අවස්ථාවල අයවැය ලේඛනය පවා කළඑළි දැක්කේ මෙම මුද්‍රණාලය තුලිනි. මේ කාලය වනවිට මුද්‍රණාලයේ සේවක පිරිස අත්දැකීම් වලින් හා දැනුමෙන් සන්නද්ධ වී සිටි නිසා අභියෝග ජය ගැනීමට පසුබට වූයේ නැත.

වසර 1996 ඉකුත් වී මේ වනවිට වසර 22 ක් පමණ ගත වී ඇත. පැරණි යන්ත්‍ර නිතිපතා නඩත්තු කරමින් මුද්‍රණාලයේ සේවක පිරිස මුද්‍රණාලය පවත්වා ගෙන යයි. උසස් පෙළ හදාරන සිසුන්ටත් විශ්ව විද්‍යාල සිසුන්ටත් ඉතාමත් අඩු මිලකට සටහන, News survey, කුරුප්පේඩු යන වාර ප්‍රකාශන තවමත් මහබැංකුවට නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත්තේ මෙම මුද්‍රණාලය නිසාය. මීට අමතරව ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කර පළ කරන ලද පොත්පත් ද ඉතාම අඩු මිලට සපයා ඇත. මහබැංකුවේ සම්පත් දායකයින් මෙම ප්‍රකාශනවලට තම ශාස්ත්‍රීය දැනුමලබා දෙන්නේ ආර්ථික වාසි බලාපොරොත්තුවෙන් නොවේ.

මහබැංකු මුද්‍රණාලය වැසී ගියහොත් රටේ ආර්ථිකය සම්බන්ධයෙන් උනන්දුව දක්වන පාසල් ශිෂ්‍යයින්, ගුරුභවතුන්, විශ්ව විද්‍යාල සිසුන්ට සහ වෙනත් පාඨකයින්ට මෙතරම් පහසු මිලට එකී ප්‍රකාශන ලබාගැනීමට පෞද්ගලික අංශයෙන් පිටිවහලක් ලැබෙන්නේ නැත. **සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මහබැංකුවට රටේ බුද්ධිමත් ජනතාව ඉක්මනින් හා සාර්ථකව ආමන්ත්‍රණය කිරීමට ඉඩක් ලැබෙන්නේ මෙම පුංචි මුද්‍රණාලය නිසාය.** පවතින කාලීන අයහපත් වාතාවරණය යටතෙ මහබැංකුවට තම ස්වාධීන අදහස් ප්‍රකාශ කිරීමට මිළ කළ නොහැකි උදව්වක් මෙම මුද්‍රණාලය මගින් ලබා ගත හැකිය. අද ශ්‍රී ලංකාවේ වැදගත් ආයතනවලට මුද්‍රණාලයක් හා සංනිවේදන අංශයක් ඇත. කොළඹ මහනගර සභාව පවා තම පැරණි මුද්‍රණාලය යාවත්කාලීන කර තවමත් පවත්වා ගෙන යයි.

එහෙත් මහබැංකු මුද්‍රණාලයය දැන් තීරණාත්මක මංසන්ධියකට පැමිණ ඇත. මහබැංකුවේ සිදු කරන ලබන මුද්‍රණ කටයුතුවලින් දැන් රාජගිරියේ මුද්‍රණාලය වෙත පැවරෙන්නේ කොටසක් පමණය. එම කටයුතු කරගෙන යාම සඳහා අපගේ මුද්‍රණාලයයේ ඇත්තේ ඉතාමත්ම පැරණි යන්ත්‍ර කීපයකි. එම යන්ත්‍රවල පවතින ඉස්තරම් භාවය හා පළපුරුදු සේවක පිරිස නිසා මුද්‍රණාලයට මෙම කටයුතු පවත්වා ගෙන යාමේ හැකියාව ලැබී ඇත. 2016 මහබැංකු වාර්ෂික වාර්තාවේ මහබැංකු මුද්‍රණාලය ගැන පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කර ඇත.

“උසස් නිමාවකින් යුතු මහබැංකු මුද්‍රණ අවශ්‍යතා ඉටුකර දීම සඳහා රෑ රටා සැලසුම් කිරීම, වර්ණ යෝජනය හා මුද්‍රණ කටයුතු සිදුකිරීම ඔස්සේ මුද්‍රණාලය සිය දායකත්වය ලබා දුන් අතර 2016 වසර තුළ මහබැංකු මුද්‍රණ කාර්යයන් 214ක් නිම කරන ලදී. මෙම කාර්යයන් අතර සටහන, (වෙලුම් 04 ක්), News survey (වෙලුම් 3ක්) කුරුප්පේඩු(වෙලුම් 02 ක්) යන වාර ප්‍රකාශන, මාසික විවරණිකාවන් (වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම සඳහා වර්ණ යෝජනය පමණක්) සැදෑව, නියෝජ්‍ය අධිපති පී සමරසිරි මහතා විසින් රචිත ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති ග්‍රන්ථය (නැවත මුද්‍රණය) සහකාර අධිපති සී. පී. ඒ. කරුණාතිලකමහතා විසින් රචිත ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති ග්‍රන්ථය, (නැවත මුද්‍රණය) සහකාර අධිපති සී. පී. ඒ. කරුණාතිලක මහතා විසින් රචිත ආර්ථික විද්‍යා මූලධර්ම ග්‍රන්ථයේ සිංහල සහ දෙමළ මුද්‍රණ, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට පියවරෙන් පියවර මාර්ගෝපදේශනය, (නැවත මුද්‍රණය) 66 වන සාංවත්සරික සැමරුම් දේශනය ඇතුළත් පොත් පිංච හා ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන යන ප්‍රකාශන ඇතුළත්ය. තවද විවිධ ආර්ථික ප්‍රතිපත්ති

මුද්‍රණය කිරීම හා සපයා දීම, මහබැංකු නිලධාරීන්ගේ නාමපත්‍ර මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමද මුද්‍රණාලය විසින් සිදු කරන ලදී.”

මහබැංකු මුද්‍රණාලයේ සේවය කරන්නේ ඉතා සුළු පිරිසකි. නව පත් කිරීම් සිදු නොවන බැවින් මෙම පිරිස තව අවුරුදු කීපයක් ඇතුලත විශ්‍රාම යනු ඇත. එවිට ඔවුන්ගේ හසල අත්දැකීම් වලින් ප්‍රයෝජනයක් ගැනීමට මහබැංකුවට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන්නේ නැත. එම දැනුම මහබැංකවට ලබා ගන්නට වන්නේ ඉහළ මිලක් ගෙවීමෙන් පසුව පෞද්ගලික අංශයෙනි. 1998 දී සිදු වූ මුද්‍රණ ශිල්පීන්ගේ වර්ජනය වැනි ආපදාවක් නැවත සිදුවුවහොත් මහබැංකුවට පිහිටක් නැත.

මුද්‍රණ ක්ෂෙත්‍රයේ පවතින තත්වය මත සාමාන්‍යයෙන් 35% කපමණ ලාභ තීරුවක් මුද්‍රණ කරුවන් උපයා ගනී. මෙම ප්‍රමාණය මුද්‍රණාලයේ සේවක පිරිසේ නඩත්තුව සඳහා වැයකර වුවද මුද්‍රණාලය පවත්වා ගෙන යෑම වැදගත් බව කිව යුතුය. තවත් කල් නොදමා මුද්‍රණ කර්මාන්තයේ නියුතු තරුණයින් බඳවාගෙන අපේ පළපුරුදු කාර්ය මණ්ඩලය ලවා ඔවුන් පුරුදු පුහුණු කරගතහොත් එය මහබැංකුව සතු වටිනා මිනිස් සම්පතක් වනු නොඅනුමානය. අළුතින් යන්ත්‍ර සූත්‍ර සවි කිරීමට යන වියදම කාලයාගේ ඇවෑමෙන් කිසි විටෙකත් අපතේ යාමක් වන්නේ නැත.

පවතින යන්ත්‍ර-සූත්‍ර පරණ යකඩවලට විකුණා මුද්‍රණාල පරිශ්‍රය ගබඩා කාමරයක් බවට පත් කර එයට වසා දැමීම පහසු කාර්යයකි. මහබැංකුව තමන් මුද්‍රණ ක්ෂෙත්‍රයේ ලබාගත් දැනුම හා පළපුරුද්ද අහිමි කරගන්නවාට වඩා වර්තමානයේ එළැඹී බාධක හමුවේ තම දෙපයින් නැගී සිටීමට උත්සහ දරණ මොහොතක ඊට උපස්ථම්භක කරගත හැකි මේ පුංචි ළිඳ වසා දැමීම නුවණට හුරු ක්‍රියාවක්ද?

2018 ජනවාරි මස තුන්වන දින ශ්‍රී ලංකා මහබැංකුවට වැදගත් දිනයක් විය. ආන්දෝලනාත්මක බැඳුම්කර සිද්ධිය පිලිබඳව ජනාධිපතිතුමා ප්‍රකාශයක් කරමින් මහබැංකුව ආශ්‍රිතව තිබූ දුබලතා සහ ඒවා වළක්වාලීමට ගතයුතු ක්‍රියාමාර්ග ගැන ඉඟි කීපයක් ප්‍රකාශ කරන ලදී. මෙදිනම උදය වරුවේ මහබැංකු අධිපතිතුමා විසින් ස්වකීය ආර්ථික මාර්ගෝපදේශන සැලැස්ම ජනතාව හමුවේ තැබීය. **මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මහබැංකුවේ ස්වාධීනත්වය රැකගතයුතු බව ද අවධාරණය කරන ලදී.** ශ්‍රී ලංකාවේ ස්වකීයම වූ අනන්‍යතාවයන් ආරක්‍ෂා කර ගන්නා ආයතන තම මතය ජනගත කිරීමට තමන්ගේම සංනිවේදනය සඳහා කුඩා මුද්‍රණාලයයන් පවත්වා ගෙන යන අවදියක මහබැංකුව තමන් සතු අත්දකීම් හා පළපුරුද්ද ඇති රාජගිරියේ පුංචි මුද්‍රණාලය වැසී යාමට ඉඩදීම තම ස්වාධීනත්වයට කරගන්නා හානියක් නොවන්නේද?

# විධායක කමිටු තොරතුරු

2017 වර්ෂයේ ජූලි - දෙසැම්බර් වකවානුව තුලදී විධායක කමිටුව රැස්වීම් වාර එකොලහක් පවත්වා ඇත. විධායක කමිටු සංයුතියේ වෙනස්කම් කිහිපයක් ඇතිවිය. 2017-05-06 දින රැස්වීමෙන් පසුව සභාපති - ජයලාල් ජයවර්ධන මහතා මාස 3 ක කාලයක් සඳහා විදේශ ගතවීම නිසා උප සභාපති ලක්ෂ්මන් ද සිල්වා මහතා වැඩ බලන සභාපති වශයෙන් කටයුතු කරන ලදී. ලේකම් එච්. එම්. පී. හේරත් මහතා තමන් මාස 10 කාලයක් සඳහා මුදාහරින මෙන් ඉල්ලා සිටි හෙයින් උපලේකම් ආරියදාස තන්ත්‍රිගේ මහතා වැඩ බලන ලේකම් වශයෙන් කටයුතු කරන ලදී. ලේකම් මහතාගේ දීර්ඝ කාලීන නිවාඩුව නිසා කමිටුවට සහයෝගය ලබාගැනීමට බන්දුල විමලසූරිය මහතා තාවකාලික වශයෙන් උපලේකම් තනතුරට පත් කරන ලදී

2017 ඔක්තෝම්බර් මාසයේදී ජයලාල් ජයවර්ධන මහතා දිවයිනට පැමිණියේය. එතැන් සිට එතුමා සභාපතිධූරයේ වැඩ කටයුතු කළ අතර, ලේකම් එච්. එම්. පී. හේරත් මහතා ද විධායක කමිටුවට වාර්තා කළ නමුත්, ලේකම්ධූරයේ කටයුතු කිරීමෙන් මුදවා හරින ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව එච්. එම්. පී. හේරත් මහතා විධායක කමිටු සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට එකඟ විය. බන්දුල විමලසූරිය මහතාට තවදුරටත් විධායක කමිටුවේ කටයුතු කරගෙන යාමට පසුබිම සලස්වමින් ර. මු. සෙනෙවිරත්න මහතා විධායක කමිටු ධූරයෙන් ඉවත්වීමට තීරණය කළේය. නමුත් ගරු සේවයක් වශයෙන් ර. මු. සෙනෙවිරත්න මහතාට විධායක කමිටුවට සහභාගි වී, සංගමයේ අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කරන ලෙස සභාපතිතුමා දන්වා සිටි අතර, එය යෝජනාවක් වශයෙන් ද සභා සම්මත විය. මේ අනුව සංගමයේ ලේකම් වශයෙන් ආරියදාස තන්ත්‍රිගේ මහතාත්, උප ලේකම් වශයෙන් බන්දුල විමලසූරිය මහතාත්, පත් කරගන්නා ලද අතර, උපලේකම් වශයෙන් ''සැඳෑව'' සඟරාව සංස්කරණය කිරීමේ කටයුතු තවදුරටත් පවත්වා ගෙන යන ලෙස බන්දුල විමලසූරිය මහතාට දැනුම් දෙනු ලැබීය.

ගරු සඟරා සංස්කාරක වශයෙන් කටයුතු කළ අමරපාල කරසිංහආරච්චි මහතා සුරතේ අබාධයක් නිසා නිවාඩු ඉල්ලා සිටිබැවින් ඊට අනුමැතිය ලබා දුන් අතර ර.මු. සෙනෙවිරත්න මහතා ගරු සංස්කාරක වරයා වශයෙන් පත් කරගන්නා ලදී. ගරු ලේකම් ආරියදාස තන්තිරිගේ මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලයේ උප ලේකම් බන්දුල විමලසූරිය මහතා වැඩ බලන ලේකම් වශයෙන් කටයුතු කලේය.

# මහ බැංකු විශ්‍රාමික සංගමය - තුන් දින චාරිකාව - යාපනය







**මෙම වර්ෂයේ තුන් දින චාරිකාව නාගදීපය ඇතුළුව යාපනය ප්‍රදේශයේ වැදගත් ස්ථාන ආවරණය වන පරිදි පැවැත්වීමට සැලසුම් කර ඇත. 2018 මාර්තු මස 28 වන දින පිටත් වී 30 වන දා ආපසු ඒමට නියමිතය.**

- ✓ පිටත් වන දිනය සහ වේලාව - 2018 මාර්තු මස 28 වන දින උදේ 4.00 ට වැල්ලවත්ත දුම්රිය ස්ථානය (මැරීන් ඩ්‍රයිව්) අසලින්
- ✓ ගාස්තුව - රු. 10,000/- සාමාජිකයා/අතිරේක තවත් රු. 10,000/= ක් ගෙවා එක් අමුත්තෙකු කැඳවා ගත හැකිය. රු. 11,000/- සාමාජික නොවන අයට
- ✓ මුදල් ගෙවිය යුතු දිනය - 2018 මාර්තු 12 ට පෙර
- ✓ මුදල් ගෙවිය යුතු ක්‍රමය - 1. චෙක්පතක් නම් සංගමයේ නමට ලියා "ආදායකයාගේ ගිණුමට පමණි" යනුවෙන් රේඛණය කරන්නී

  2. ගිණුමට මුදල් තැන්පත් කරන්නේ නම් හැටන් නැෂනල් බැංකුවේ 002010016134 දරණ ගිණුමට බැර කොට රිසිට් පතේ පිටපතක් එවන්න.

**විමසීම් -**

| | | | |
|---|---|---|---|
| ජයලාල් ජයවර්ධන මහතා | 0777412289 | ආර්.ඩී. ගුණසේන මහතා | 0718026411 |
| ආරියදාස තන්තිරිගේ මහතා | 0718064238 | ලීලා මොහනසුන්දරම් මහත්මිය | 0778378506 |
| පද්මිණි විජේරත්න මහත්මිය | 0112643647 | | |

**ගරු භාණ්ඩාගාරික, ආර්.ඩී. ගුණසේන මහතා, 364 ඒ, ජිනසේන මාවත, මහර,කඩවත**

නම ............................................................ විශ්‍රාම අංකය ..........................

දුරකථන අකය ............................................................ ජංගම ..........................

චෙක්පතේ හෝ රිසිට්පතේ අංකය ............................ මුළු මුදල ..........................

සහභාගී වන සංඛ්‍යාව ............................................

.......................... ..........................

දිනය අත්සන

# CENTRAL BANK PENSIONER'S ASSOCIATION 3 DAY TOUR TO JAFFNA.







**The executive committee of the Association has arranged a tour of Jaffna from 28th to 30th march 2018. We have planned to visit Nagadheepa and important places in Jaffn**a.

Date & Time of departure: 28th March 2018 at 4.00 AM
Place of departure: Near wellawatta Railway Station. (Marine Drive).
Charges: Rs. 10,000/= per member/a member allowed to bring one guest for additional Rs. 10,000/=
Rs. 11,000/= per nonmember.

Those who are Interested, Please state the number of persons accompany you and a cheque written for the total amount favoring Central Bank Pensioners' Association crossed Account Payee or Deposit the total amount to H.N. Bank account No. 002010016134 and send a copy of the deposit receipt to reach Treasurer Mr. R.D. Gunasena.No.364A Jinasena Mawatha, Mahara, Kadawatha, on or before 12th March 2018.

**Contact persons.**

| | |
|---|---|
| Jayala Jayawardena | 0777412289 |
| R.D.Gunasena | 0718026411 |
| Ariyadasa Thanthirige | 0718064238 |
| Leela Mohanasundaram | 0778378506 |
| Padmini Wijeratne | 0112643647 |

**Treasurer, R.D. Gunasena, 364A , Jinasena Mawatha, Mahara, Kadawatha**

Name …………………………………… Pension No. .....................................................
Tel No …………………………………......... Mobile No ……………………………….................
Cheque /Bank Deposit Slip No. …………………………Amount ..........................................
Number of Persons ……………………..

……………....................                                  ............................................
Date                                  Signature









# එක්දින විනෝද චාරිකාව

විශ්‍රාමික දිවියේ හුදකලා බව මදකට මගහැරීමේ අදහසින් ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ අපි මෙවර එක්දින විනෝද චාරිකව සංවිධානය කළෙමු.

පිළියන්දල මඩපාත, වින්රිච් හෝටලය (Vinrich Hotel) වෙත ඔක්තෝම්බර් මස 31 දින කඩවත, කදාන හා නුගේගොඩ යන ප්‍රදේශවල සිට බස් රථ තුනකින් ළඟා වූයේ 140 ක් පමණ සොයුරු සොයුරියන් පිරිසක් සමගයි.

නාගරික බවට පත්වන පිළියන්දල නගරයේ තවමත් සුන්දරත්වය ආරක්ෂා කරගෙන තිබෙන මඩපාත ගම්මානයේ නිසංසල පෙදෙසක පිහිටා ඇති වින්රිච් හෝටල් පරිශ්‍රය අප සිතට ගෙන දුන්නේ ආශ්වාදයකි.

එදින තරමක් වැසි සහිත වූ නිසා හෝටලයේ බිම් මහලේ අපට සුහද හමුව පැවැත්වීමට අපහසු වූ හෙයින් හෝටල් කළමනාකාරීත්වය ඉහළ මහලේ පිහිටි මනරම් ශාලාවක් අපට ලබා දීමට කටයුතු කරන ලදී. හැම දෙයක්ම සිදු වන්නේ හොඳටයි කියා කියමනක් ඇති බව අපට පසක් වූයේ විසිරී යා නොදී සියළු දෙනාටම එම ශාලාව තුළ එකතු වී සිටීමට බිම්මහල අහිමිවීම ආශිර්වාදයක් වූ නිසයි.

කෙසේ හෝ තම තම හිතවතුන් සමග ආගිය තොරතුරු, පෙර මතක සටහන් ආවර්ජනය කරමින් කිසිලෙසකින්වත් තම වයස ගැන සිතීමටවත් කාලයක් නොමැතිව සියළු දෙනා සතුටු සාමිචියේ යෙදුනහ.

අප සංගමයේ සභාපති ජයලාල් මහතා සියළු දෙනාම ආදරයෙන් පිළිගෙන සංගමයේ ක්‍රියාකාරකම් ගැන පැහැදිලි කිරීමක් ප්‍රථමයෙන් සැමට ලබා දුන්නේය. ඉන්පසු සුහද හමුව ආරම්භ විය.

කඩිසර ලෙස සොයුරු සොයුරියන් තරගවලට සහභාගී වූයේ තරග දිනා ගැනීමට වඩා සතුටු වීමට අවස්ථාව ලබා ගැනීමටය. ගම්පහ ප්‍රදේශයේ සිට පැමිණි මාකොළ ප්‍රදීප් සංගීත කණ්ඩායම පිරිස ආමන්ද්‍රානන්දයට පත් කරමින් මියුරු ගායනයෙන් හා වාදනයෙන් සැමදෙනා පිනවූ අතර තන්ත්‍රීගේ, ප්‍රනීතා, සුනිල්, කරු ගී ගයමින් දස්කම් දැක්වූහ. සුපුරුදු ලෙස සිත් ඇද ගන්නා වාග් විලාශයෙන් හා කථනයෙන් අමරපාල මහතා සියළු දෙනාගේම මනස ඒකරාශී කළේය.

වෙනදාට වඩා විශේෂත්වය වූයේ එදින තරග කීපයක් සංවිධානය කර තිබීමයි. වියපත් වුවත් මතක ශක්තිය උරගා බැලීමට හැකි වූයේ මේස 17 ටම ප්‍රශ්ණාවලියක් පද්මිණී විජේරත්න ලබා දීමෙන් පසුවය. සියළු දෙනාම ඉතා උනන්දුවෙන් Ques Paper පත්‍රයට උත්තර ලිව්වේ විනාඩි 15 ක පමණ කාලයක් ඇතුලතය. නිවැරදිව ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ කණ්ඩායම් 3 ක් සිටි නිසා අල්විස් මහතාගේ මේසයේ සිටි අය ජයග්‍රහණය කළේ ලොතරැයි ක්‍රමයටය. අප තවමත් බුද්ධිමත් බව ඉන් ප්‍රකට විය. එම මේසයේ සිටි සැමට ත්‍යාග හිමිවිය.

සංගීත පුටු තරඟ, බැලුන් පිපිරවීම ආදී තරග කාන්තා පිරිමි වශයෙන් පැවැත්වූ අතර, ඉතා කඩිසර ලෙස සොයුරු සොයුරියන් නටමින් තරගවලට සහභාගී වූයේ තරග දිනා ගැනීමට වඩා සතුටු වීමට අවස්ථාව සැලසූ නිසා බව කාහටත් පෙනුනි. ජයන්ති ලීලාරත්න, පියසිරි රණවීර, සුජාතා සෝමසිරි, ජයසූරිය මහත්මිය ආදීන් ජයග්‍රහණය කළහ.

එදින දිවා ආහාරය ඉතා ප්‍රනීත ලෙස වින්රිච් හෝටලයේ සකසා තිබූ අතර, සියලු දෙනා සතුටින් ආහාර හා අතුරුපස ලබා ගත්හ. අනතුරුව තරග ජයග්‍රාහකයන්ට සභාපතිතුමා ත්‍යාග ලබා දුන්නේය. තරග සංවිධානය. ත්‍යාග ගෙන ඒම පිළිබඳව සභාපතිතුමා, සමාජයීය ලේකම්ට ස්තුති කළේය. ජයලාල්, ලක්ෂ්මන්, තන්ත්‍රීගේ, කබ්රාල්, ගුණසේන යන සොයුරන් මෙම චාරිකාව සංවිධානය කිරීමට වෙහෙස වී කටයුතු කළ බව මෙහිදී සටහන් කළයුතු අතර සියළු දෙනාගේම ගෞරවය ඔවුනට හිමිවිය.

තේ පානයෙන් අනතුරුව නැවත මෙලෙස හමුවීමේ බලාපොරොත්තුවෙන් සියළු දෙනාම පිටවී ගියහ.

**පද්මිණී විජේරත්න**

# ලාල්ගේ පුස්තක ත්‍රිත්වය

වර්ෂ 2017 ජුලි 22 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ තිබූ එක්තරා ජන එකතුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින් වන අපගේ චිත්ත සන්තානයන් තුළ සියුම් ආඩම්බරයක්ද, සතුටක්ද ඇති කළේ, අපගේ සාමාජික ලාල් හේවාපතිරණ එදින පුස්තක ත්‍රිත්වයක්ම දොරට වැඩූ නිසාවෙනි. නොඑසේ නම් සමාජගත කළ නිසාවෙනි. එම පුස්තක ත්‍රිත්වය කියවීමෙන් පසු සංගමයේ මාධ්‍ය ප්‍රකාශක .සැඳෑව. මගින් ඒ පුස්තක පිළිබඳව සාමාජිකත්වය දැනුවත් කිරීම කාලෝචිත යැයි අදහසින් මෙය ලියමි.

**01. ජෝර්කස්, ජෝර්කස් ඇන්ඩ් ජෝර්ක්ස් සහ විහිළු තහළු**

ලාල්ගේ .ජෝර්ක් පොත. සිංහල ලේඛන කලාවට නුහුරු වූවකි. විශේෂයෙන්ම ඉංග්‍රීසියෙන් ලියැවුණු .ජෝර්ක් පොත්. ලොව පුරා ප්‍රචලි වුවත් මෙම පොත සිංහලට එක් වූ ඒ වර්ගයේ පළමු පොත යැයි සිතමි. ග්‍රාම්‍යත්වයෙන් බර අශ්ශීල කතා රැගත් ඊනියා විහිළු, තහළු සඟරා සිංහලෙන් මුද්‍රිතව නැතැයි මෙයින් අදහස් නොකරන අතර, ලාල්ගේ .ජෝර්ක් පොත. ඒවායේ නිර්මාණකරුවන්ට හාස්‍ය නම් කුමක්දැයි වටහා දෙනු ඇත. අවස්ථාවට සුදුසු පරිදි අනෙකුත් අය හා රස විඳිය හැකි විහිළු තහළු රාශියක් ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් ඉදිරිපත් කර කියවන්නා හාස්‍යයෙන් පිනවීමට සම්පාදක ලාල් ගෙන ඇති උත්සාහය සම්පූර්ණයෙන්ම සාර්ථක වූවකි.

**02. බුද්ධ වචනය සදාතනිකයි.**

බුදුරජාණන් වහන්සේගේ දේශනා පාඨ දෙසීයයක් අංකිතව ගොනු කොට මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. ඒ ඒ දේශනා පාඨය අවසන එයට අදාළ කතා වස්තුව සඳහන් කර තිබීම සවිස්තරාත්මක තොරතුරු ගවේෂී පාඨකයින්ට පහසු වූවකි. බුද්ධ ධර්මයේ මුදුන් මල්කඩක් සේ සැලකෙන ධම්මපදයේ අන්තර්ගත බොහෝ ගාථා, උක්ත දේශනා පාඨ හා ඍජුවම සම්බන්ධමූත්, ලාල් හේවාපතිරණයන් .බුද්ධ වචනය සදාතනිකයි. සිය කෘතියේ සංස්කාරක සටහන්හි පමණක් ඒ බැව් සඳහන් කර ඇත්තේ යාන්තමිනි. දේශනා පාඨ විවරණයේ අවසන අදාළ කතා වස්තුව සඳහන් කලාක් මෙන්ම ධම්ම පදයේ අදාළ වග්ගය සඳහන් කළා නම් සුදුසු යැයි සිතමි. එසේ වුවද සචේතනිකව හෝ අචේතනිකව සිදුවී ඇති මෙම අතපසුවීමේ සාධනීය පැතිකඩක්ද මම දකිමි. අභිධර්මය ඇතුළු නොයෙකුත් දහම් කරුණු ද, ධම්ම පද ගාථා විවරණ ද, භාවනා ක්‍රමද සඳහන් පොත් විශාල සංඛ්‍යාවක් ධර්මකාමී දාන පතියන් විසින්, දහම් පඬුරු ලෙස මුද්‍රණය කර නොමිලේ සමාජගත කරන මෙවන් අවධියක සංස්කාරක සටහන් හි ධම්මපදය පිළිබඳව ප්‍රමුඛත්වයෙන් ලියවුනේ නම් ලාල්ගේ උත්සාහයද එම දහම් පඬුරු ගොන්නේම අතරමං වීමට අවකාශ තිබුණි.

අත පොවන මානයේ දහම් ග්‍රන්ථ/දහම් පඬුරු සුලභ වීම, ඒවායේ අගය ක්ෂය කර අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමේ හැකියාවද දුර්වල කරයි. පාරමී පිරුවන්ට හැර සාමාන්‍ය ජනතාවට ධර්මය දුෂ්කරවූ ද, මිහිරි නොවූ ද විෂයයකි. ශ්‍රව්‍ය, දෘෂ්‍ය සහ වෙනත් උපාය මාර්ග වලින්ද, ධර්මය අවබෝධ කරවීමට කොතෙකුත් උත්සාහ දැරුවද, ධර්මය අවබෝධ කර ගත්තවුන් අල්ප වන්නේ එහෙයිනි. කොතරම් දහම් පොත් පරිශීලනයට ලැබුණද, වර්තමානයේ පාඨකයින් බොහෝ දෙනෙක් දහම් පොත් කීපයකට වඩා කියවන්නේ නැත. එයට හේතුව දහම් පොත්හි එකම ආකාරයේ ගූඪ, නීරස කරුණු පමණක් අන්තර්ගත යැයි පූර්ව නිගමනයකට ඔවුන් පැමිණ සිටින බැවිනි. .බුද්ධ වචනය සදාතනිකයි. ග්‍රන්ථය ආකෘතියෙන් ද, භාෂා ශෛලියෙන් ද, උක්ත (හුරුපුරුදු) මාවතින් වෙනත් මඟකට පිවිසි තිබීම සතුටට කරුණකි. විශේෂයෙන්ම දහම් ග්‍රන්ථ වලට එතරම් නුහුරු අංකිත ආකෘතියක් තුළ ඔහු තෝරාගත් දේශනා පාඨ සුමට වූ ද, සරල වූ ද, ශෛලියකින් ඉදිරිපත් කර තිබීම අතෙකින් බලන විට උගුරට හොරා බෙහෙත් කවන්නාක් මෙන් දහම් නොරිසියවුනට, නොදැනුවත්වම දහම් ඉගැන්වීමකි. ඉතා කාර්යබහුල දහම් ලැදි පාඨකයෙකුට වුවද, ලත් අවසරයකින් මෙහි පාඨ කීපයක් කියවා තේරුම් ගෙන, අවස්ථාව ලැබෙන අයුරු ඉතිරිවා කියවිය හැකිය.

ලාල් සිය අන්තර්ගතයන් සඳහා තෝරා ගෙන ඇති දේශනා පාඨ මොනවාදැයි මීළඟට සැකෙවින් විමසා බලමු. දේශනා පාඨ සියල්ලම ශ්‍රී මුඛ පාලිය බැවින් ඒවා පිළිබඳ අප වැන්නවුන් තුළ කිසියම් විචාරයක් හෝ විමසීමක් තිබිය නොහැකිය. මේ දේශනා බොහොමයක් බුදුන් දවස භික්ෂූන් අරඹයා සිදුකර තිබුණ ද, ඒවා අපගේ ප්‍රායෝගික ජීවිතයට .උපදේශ ශතකය. .ප්‍රත්‍ය ශතකය. (සංස්කෘත) මෙන් බොහෝ වටිනා දේ කියා දෙයි. ඉවත දැමිය හැකි එකම අදහසක්වත් මේ අතර නැත. උදාහරණ වශයෙන් පිළිවෙලින් ධම්ම පදයේ යමක වග්ගයේ අංක 002, හා නිරය වග්ගයේ 005 ගාථා, විමර්ශනයට පාත්‍ර ග්‍රන්ථයේ අංක 001 හා 121 පාඨ කියවා බැලීම මැනවි. ලාල්ගේ .බුද්ධ වචනය සදාතනිකයි. කෘතිය අත්පොතක් වශයෙන් පරිශීලනය කිරීම අප මනා පෞරුෂයකින් යුත් නිහඬ බුද්ධිමතුන් කරනු ඇති

කරුණු මෙසේ වුවද යථෝක්ත ග්‍රන්ථයේ මතභේදයට තුඩුදෙන සටහන් දෙකක්ද එහි සම්පාදක විසින් තබා ඇති බව කිව යුතුය. පළමුවැන්න (184) .විඤ්ඤාණය යනු සංජානනය..... නොහොත් නිවැරදි දැක්ම තුළින් උදාකරගන්නා බුද්ධියයි.. මෙය සාවද්‍ය විග්‍රහයක් බැව් කණගාටුවෙන් වුවද කිව යුතුය. බුද්ධිය හා විඤ්ඤාණය අතර කිසිම සම්බන්ධකමක් නැති අතර විඤ්ඤාණය තුළ නිවැරදි දැක්මක් ගැබ් ගැන්විය නොහැකිය. විඤ්ඤාණය පිළිබඳ දීර්ඝ විස්තරයකට මෙය අවස්ථාව නොවුනද, විඤ්ඤාණය යනු නිර්වාණය දක්වා සත්වයා භවයෙන් භවයට රැගෙන යන්නාවූ නොබිඳෙන හුයක් බඳු .සිතම. වේ. (නිර්වාණ විනිශ්චය සහ පුනරුත්පත්ති ක්‍රමය-පූජ්‍ය රේරුකානේ චන්ද විමල හිමි පිටුව 135)

දෙවැන්න (199) ........... සත්ව ඝාතනය හෙළා දකින එකම න්‍යාය පවතිනුයේ බුදු දහම තුළ පමණකි.. මෙය ද සාවද්‍ය මතයකි. බුදු දහමට කර ගන්නා සාධාරණ නොවූ බැර තැබීමකි. කිතුදහම ගෙන බලමු. කිතු දහම සත්ව ඝාතනය සම්බන්ධයෙන් නිහඬ පිළිවෙතක් අනුගමනය කරන බැව් සැබෑ මුත් ඝාතනය අනුමත නොකරයි. මැද පෙරදිග එඬේරුන්ට .පානාතිපතය. සමාදන් කරවීමට ගියහොත් කිතුදහම උපන් ගෙයිම මියයන බැව් දැනගැනීමට තරම් උන් වහන්සේ ප්‍රඥාසම්පන්න නොවූයේ යැයි ඔබ සිතන්නේද? එහෙත් භාරතය තුළ බුද්ධ පූර්වයේ සිට වර්තමානය දක්වාම උග්‍ර අහිංසාවාදී ආගම්ද, තනි පුද්ගලයින්ද, ක්‍රියාකාරී වන හෙයින් බුදුන් වහන්සේට .පානාතිපාතය. සමාදන් කරවීමේ ගැටළුවක් නොවීය.

**03 විද්වත් කියමන්**

මෙය සිංහල පුස්තකාලයට මෑතකදී එක් වූ විශිෂ්ඨ ගණයේ ග්‍රන්ථයකැයි කිව යුතුය. සම්පාදක ලාල් විසින් .ව්‍යක්ත කථිකත්වයට හා කෘත හස්ත ලේඛකත්වයට නිර්මාණශීලි අත්වැලක්.... යැයි ඉතා නිහතමානී ලෙස හඳුන්වා දෙන මෙම ග්‍රන්ථය ඊට වඩා බොහෝ දුර අප කැඳවාගෙන යයි. මෙවැනි කුඩා ලියවිල්ලක් තුළ .විද්වත්. කියමන් විචාරයකට ලක්කිරීමට යාම නිශ්ඵල ව්‍යායාමයකි. මෙය බුද්ධිමය ලියවිල්ලක් පමණක් නොව පාඨකයාට විනෝදයද නිරවුල් ජීවිතයකට බොහෝ උපදෙස්ද සපයන්නකි. විද්වද් කියමන් අන්තර්ගත මෙවැනි පූර්ණ ග්‍රණ්ථයක් සකස් කිරීමේදී ජීවන අත්දැකීම් වලින් පීඩිත වූද, පෝෂිත වූද, වර්තමානයේ සාමාන්‍ය ජනතාවගේ .විද්වද්. කියමන් රැගත් අතිරේක පරිච්ඡේදයක් ඇතුළු නොවීම අඩුවක් නොවුවද, ඒ සඳහා ලැබුණු අනර්ඝ අවස්ථාවක් අපට අහිමි වූ වාසේ දැනේ. එසේ වූවානම් ලාල්ගේ ,විද්වද් කියමන්, තවදුරටත් එයින් අලංකාර වනු ඇත. තට්ටු කරන්නාට දොර ඇරේ - දොර අරින්නාට තට්ටු වේ. ආලය අන්ධය - සත්‍ය ආලය අන්ධය. බිහිරිය. මුදල් කථා කරන විට සත්‍ය නිහඬ වේ. මේවා වර්තමානයේ භාවිතයට එක්වන එබඳු .විද්වද් කියමන්. කීපයකි.

ලාල් මහත්මයාණෙනි, ඔබ ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයට ආඩම්බරයකි. ආභරණයකි. අපි ඔබට මනා සෞඛ්‍ය ද, දීර්ඝායු ද තව තවත් බොහෝ නිපුණතා ද, ප්‍රාර්ථනය කරමු.

ගෝමි (624)
0112 926374

**CENTRAL BANK PENSIONERS' ASSOCIATION**
**104/8 Stanly Thilakarathna mw.**
**Nugegoda.**
**Tel: 0777412289: 0718064238**
**Date. 31/Jan/2018**
**NOTICE**

The annual General Meeting of the Association will be held on the **Saturday the 21st April 2018** at the Center for Banking Studies, 58, Sri Jayawardenapura Mawatha, Rajagiriya.

You are invited to submit resolutions to be taken up at the A.G.M, to reach Secretary/President **on or before 15th March 2018.** The resolutions should be proposed and seconded by a member of the association and duly signed.

Ariyadasa Thanthirige
Secretary.
On behalf of the executive Committee.

**මහබැංකු විශ්‍රාමික සංගමය**
**104/8, ස්ටැන්ලි තිලකරත්න මාවත,**
**නුගේගොඩ**
**0777412289 - 0718064238**

**දැන්වීමයි**

සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම **2018 අප්‍රේල් මස 21** වන සෙනසුරාදා රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 හි පිහිටි බැංකු විදු පියසේදී පවත්වනු ලැබේ.

මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන යෝජනා **2018 මාර්තු මස 15 වන දිනට පෙර** සභාපති හෝ ලේකම් වෙත එවන්න. එම යෝජනා වලට සංගමයේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් යෝජනා කර ස්ථිර කළ බවට අත්සන යොදා තිබිය යුතුය.

ආරියදාස තන්තිරිගේ
ලේකම්
විධායක කමිටුව වෙනුවෙන්

**මහබැංකුව හැම විටම රජයේ භක්තිමත් භාර්යාව විය යුතුය. ස්වාමියාගේ ගෙලට මල් මාලා වැටෙන විට නොපෙනී සිටීමටත් ගල් මුල් ප්‍රහාර එල්ල වන විට ස්වාමියාට ඉදිරි පසින් සිට සියලු ප්‍රහාර උපේක්ෂාවෙන් යුතුව විඳ දරා ගැනීමටත් සූදානමින් සිටිය යුතුය. – සැදෑව –**

# THE FOURFOLD MINDFULNESS MEDITATION.
## (Satara maha sati pattana)

The fourfold foundations of meditation are the one and only way for the liberation from this shackle of samsara (Repeated existence) or (Rebirth).
THE FOUR FOUNDATIONS:
1. The observation or Mindfulness of BODY. (Kayanu Passana).
2. The observation or Mindfulness of SENSATION. (Vedananu Passana).
3. The observation or mindfulness of MIND. (Chittanu Passana).
4. The observation or Mindfulness of Mental CONTENTS. (Dhammanu Passana).

**OBSERVATION OR MINDFULNESS OF BODY**
The Buddha explained the ana-pana sati (mindfulness) meditation in full, and again how it will be developed as the four foundations of mindfulness. Ana-pana sati meditation is that you are breathing in and out mindfully. When breathing in long, you recognise or discern that you are breathing in long. When you are breathing out long you recognise or discern that you are breathing out long. You are mindful of inhalation and exhalation of breath. There you are training yourself to breath in, sensitive to entire body and breath out, sensitive to the entire body. In this manner when you train yourself to breath in, you are calming down the body and breath out also calming down the body. This way mindfulness meditation, you can adopt into entire lifetime. This could be applied to all four foundations. Body, Sensation, Mind and Mental Contents. Example:
**Body sensation** - notice subtle body sensations such as an itch or tingling without judgement and let them pass. Notice each part of your body in succession from head to toe.
**Sensory-** Notice sights, sounds, smells, tastes and touches. Name them "sight","sound","smell","taste", or "touch" without judgement and let them go.
**Emotions-** Allow emotions to be present without judgement. Practice a steady and relaxed naming of emotions: "joy","anger","frustration". Accept the presence of the emotions without judgement and let them go.
**Urge surfing** -Cope with cravings (for addictive substances or behaviours) and allow them to pass. Notice how your body feels as the craving enters. Replace the wish for the craving to go away with a certain knowledge that it will subside.
The Load Buddha explained that how the fourfold foundation meditation could be developed through "ana-pana sati", meditation, and how these four foundations of mindfulness are applying to rise up the person to keen sense of awareness. The seven factors of awakening (sapta sambodhyanga-1. Sati 2. Dhamma Vichaya 3. Virya 4. Piti 5. Passadhi 6. Samadhi 7. Upeksha) and deliverance through wisdom. Ana-Pana sati meditation is illustrated therein exquisitely. Furthermore, the Lord Buddha exclaimed that the monk who has developed and pursued the four foundations of mindfulness moves past by crushing all defilement.

**MINDFULNESS MEDITATION**
Mindfulness is the practice of purposely focusing your attention on the present moment- and accepting it without judgement. Mindfulness is both a practice and state of mind. For an example: when you practice mindfulness meditation, you are sharpening your focus. (Usually by paying more attention to your BREATH) and training your brain to be more mindful long after you're done meditating.
Mindfulness practice is for improving emotional and physical wellbeing.

The technique of mindfulness meditator was practised by the Lord Buddha 2600 years ago. Certainly, Technique practise today in west, itself is based directly on the teachings of the Buddha who used this technique to attain NIBBANA. (Profound insight resulting in the end of suffering.) According to those teachings, mindfulness is one of the two qualities and other being VIPASSANA(concentration) The connection between mindfulness and Buddhism is very clear in the SATHI PATTANA SUTTA. (Translated into English as the discourse on the establishing of mindfulness) Here sathi means mindfulness. There the Buddha lays out the first ever set of mindfulness instructions, guiding the practitioner to place careful attention on four different aspects or the foundations. They are:
The body - Kayanu passana
Sensation or feelings - Wedananu passana.
Mind/Consciousness- Chittanu passana.
Mental contents - Dhammanu passana
Note Buddha's first foundation of mindfulness is the body (which includes the breath).
It is no coincidence that many modern mindfulness practices began by focusing on one or both these aspects. It is important to note that modern mindfulness practices are often taught secularly-with little or no mention of their BUDDHIST CONNECTIONS. Instead mindfulness practices are being often described as a form of mental training. . There is a wealth of knowledge and insight concealed in its Buddhist teachings. However, there are few who admit that the Buddhist teachings influenced them.
Professor Jon Kabat Zinn (former Professor at the University of Massachusetts, Medical Centre) revealed that his MBSR program is based on type of Buddhist meditation called Vipassana.MBSR means - (Mindfulness' Based Stress Reduction.) Vipassana translated in to English as "Clear awareness". Professor Jonathan Haid is a renowned

psychologist had said about Dhammapada. “Dhammapada (a collection of Buddhist teachings) is one of the greatest psychological works ever written. It is masterful in its understanding of the nature of consciousness and the way we are always striving and never satisfied. You can turn into it. -and People who have turned to it throughout the ages -at times of trouble, at times of loss, at times of disappointment and it take you out of yourself. It shows you that your problems, your feelings are just timeless manifestations of the human condition. It also gives specific recommendations’ for how to deal with those problems, which is to let go, to accept, and to work on you"

**HOW TO PRACTICE MINDFULNESS MEDITATION.**

Cultivating mindfulness is the key to overcoming suffering and recognising natural wisdom. In the Buddhist tradition and in contemplative psychotherapy training, we nurture mindfulness through the practice of sitting meditation. There are many different Postures to meditate. Example: walking (sakman meditation), sitting, lying down or standing; Mindfulness meditation is unique that it is not directed toward getting us to be different from how we already are. Instead, it helps us become aware of what is already true moment by moment.

Suffering less and being more aware of our inherent wakefulness would be changes from how we experience ourselves right now, or at least most of the time. Also alleviate suffering is by going more deeply into the present moment and into ourselves as we already are, not by trying to change what is already are, not by trying to change what already going on.

The lord Buddha taught us that the source of suffering is our attempt to escape from our direct experience. First, we cause suffering ourselves by trying to get away from pain and attempting to hang on to pleasure.

Second, we cause suffering when we try to prop up false identity usually known as ego. This too, does not work and instead leads to suffering.

Third, mindfulness paying precise, non-judgemental attention to the details of our experience as it arises and subsides, does not reject anything.

Fourth, in fact, the more mindful we are, the more skilful we can be in compassionate.

Fifth, there are four basic aspects worked with mindfulness’ meditation technique. They are: Body, Sensation, Mind and Mental content.

How long should you pratice? If you are new, try to start with 10 to 15 minutes and gradually increase to 20,30or 45 minutes, or a longer period.

**BENIFITS OF MINDFULNESS.**

Mindfulness meditating practices are for improving Emotional and physical Well-Being.Mindfulness is now being examined scientifically and found to be key elements in happiness.

Professor Jon Kebab Zinn founder and former director of the Stress reduction clinic at the University of Massachusetts Medical centre. Professor Kebab brought the Mindfulness Meditation into mainstream medicine and demonstrated that practicing mindfulness can bring improvement in both physical and psychological symptoms as well as positive changes in health attitude and behaviours.

Mindfulness will improve attitude that contribute to a satisfied life.

Mindfulness become fully engaged in activities, and creates a greater capacity to deal with adverse events.

Mindfulness find that they are less likely to get caught up in worries about future or regrets over the past, are better able to form deep connections with others.

**Mindfulness improves physical health.**

They are:

* Help relieve stress
* Treat heart disease.
* Lower blood pressure.
* Reduce chronic pain.
* Improve sleep.
* Alleviate gastrointestinal difficulties.

**Mindfulness improves mental health.**

* Depression.
* Eating disorders.
* Couples' conflicts.
* Anxiety disorders.
* Obsessive-compulsive disorders.

**Jayalal Jayawardena.**
B.A.(Cey:Peradeniya).

## පහන්සිළ

මදනල පහස විඳ නැලවෙන පහන්සිළ<br>
පන නල නොතිර බව පවසන පහන්සිළ<br>
නෙත තුල අඳුන රුව වඩවන පහන්සිළ<br>
එනමුදු පහන මුල අඳුරුයි පහන්සිළ

සම්බුදු කුටිය තුල දැල්වෙන පහන්සිළ<br>
දෙව් මැදුරේ පුද ලබනා පහන්සිළ<br>
කෝවිල බිමේ බැති උපදන පහන්සිළ<br>
නිසල කයට තනි රකිනා පහන්සිළ

රඟන ළඳුන් රුව වනනා පහන්සිළ<br>
නිවන් දොරට මග මවනා පහන්සිළ<br>
පැණසර බවට දෙන උපමා පහන්සිළ<br>
මත් පළගැටින් වැද නැසෙනා පහන්සිළ

ජීවන හුස්ම තිරයට දෙන පහන්සිළ<br>
සවිබල තෙලෙන් ඔද වැඩෙනා පහන්සිළ<br>
සැඩනල පහර වැද නිවුනා පහන්සිළ<br>
අස්ථිර නිසරු ජීවිතයයි පහන්සිළ

**දිබ්බැද්දේ දුල්මන් පීරිස් නො 112/ මාදුපිටිය පාර,**
**මහවිල, පානදුර. දු.ක. : 038 2245263/0715967339**

## ශ්‍රී ලංකා මහබැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ ප්‍රතිශෝධන කිරීම්

**අපනෝදක උපකරණ - ඇස් කණ්ණාඩි**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2017.12.12 දිනැති 25/2017/95 දරණ චක්‍ර ලේඛනය අනුව විශ්‍රාමික සේවා නියුක්තිකයන් සඳහා නියමිත කාලසීමාව වසර දෙකකට වරක් වශයෙන් සංශෝධනය කොට ඇත. මෙය 2015.12.08 දිනැති 25/2015/83 දරණ චක්‍රලේඛය අනුව පැවතියේ අවුරුදු 3 කට වරක් වශයෙනි. ඒ අනුව රු. 18,000/- සීමාවකට යටත්ව ඇස් කණ්ණාඩි, ශ්‍රවණාධාර, කෘතිම දත් ඇඳි (එකක් සඳහා) සඳහා වියදම් ප්‍රතිපූරණය කළ හැකිය.

### අපේක්ෂා භංගත්වය

තෙල් බිඳුවක් ලබාගන්න
සිටියෙමි මම පෝලිම අග
පොම්පෙ ළගට ලං වෙනකොට
පෙට්‍රල් ඉවරයි කියාපි!

### අනේ අනිච්චං !

බස් රියැදුරුතුමෙක් වුනේ
මගෙ පෙර වාසනාවටයි.
රජෙක් වගේ මං යන්නේ,
මුළු පාර ම මගේ නේද?

කොන්දොස්තර කෙනෙක් වෙන්න,
කොච්චර පිං කරලද මං.
බසයෙ සිටින හැම දෙනාම
මගේ යටත් වැසියෝ නේද?

### තෙල් බෙදීම

අන්න අතන තෙල් තියෙනවා.
මෙන්න මෙතන තෙල් තියෙනවා.
ඕන තරම් තෙල් තියෙනවා.
ඇමති ඉඳන් තෙල් බෙදනවා!

**3156 - මාතර - ජී. ඒ. කරුණාතිලක**

## මහබැංකු බේදවාචකයේ 22 වන අනුස්මරණ වැඩසටහන

වසර 1996 ජනවාරි මස 31 වන දින ශ්‍රී ලංකා මහබැංකුවට එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් මිය ගිය සහ ආබාධිත භාවයට පත් වූ සහෘද කැල සිහිපත් කර සිදු කරනු ලබන ආගමික කටයුතු, සෙත් පැතීම සහ අනුස්මරණ වැඩසටහන 2018 ජනවාරි මස 30 සහ 31 යන දිනයන්හිදී මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව අපට දැනගන්නට ලැබී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුස්මරණ වැඩසටහන පිළිබඳ තොරතුරු අප අතට පත් වීම සහ "සැදෑව" නිකුත් වීම අතර නිර්මාණය වූ කාලපමාව නිසා කල්වේලා ඇතිව ඔබ දැනුමත් කිරීම මගහැරී ගියේය.

අනුස්මරණ වැඩසටහන පිළිබඳ තොරතුරු ලැබුණ වහාම මහබැංකු විශ්‍රාමික සංගමයේ විධායක කමිටුව රැස්වී මෙම කාර්යයට පූර්ණ දායකත්වය සහ සහයෝගය දැක්වීමට ඒකමතිකව තීරණය කරන ලදී.

1996 බේදවාචකයට මුහුණදුන් බොහෝ දෙනා දැන් මහබැංකු සේවාවෙන් විශ්‍රාම ගොස් ඇත. නමුත් මෙම සිදුවීම කාලයේ වැලිතලාවෙන් වැසී යාමට ඉඩ නොදී තාරුණ්‍ය පෙරටු කරගෙන ගුණානුස්මරණ වැඩසටහන පවත්වාගෙන යාමට මහබැංකු අධිපති තුමා, ආගමික සංවිධාන සහ සමස්ථ කාර්ය මණ්ඩලය දරන උත්සාහයට අප සැමගේ ගෞරවය හිමි වේ.

ඉක්මනින් කැඳවා ගත හැකි සියළුම සාමාජික සාමාජිකාවන් සමග මෙම වැඩසටහනට දායකත්වය සැපයීමටත් සහභාගී වීමටත් විශ්‍රාමික සංගමයේ විධායක කමිටුවතීරණය කර ඇත.

### නිවාඩු ගමන් බලපත්‍ර ක්‍රමය 2017.12.27 චක්‍රලේඛය අංක 25/2017/93

ශ්‍රී ලංකා මහබැංකු අත්පොතෙනි මහබැංකු නිවාඩු බලපත්‍ර දීම සම්බන්ධයෙන් අංක 10 පහත සඳහන් පරිදි සංශෝධනය කොට ඇත.

පළමුවැනි පංතිය - මාණ්ඩලික පංතියේ සිට ඉහළට පරිවාස මාණ්ඩලික නිලධාරීන් IV සහV ශ්‍රේණිවලට අයත් මාණ්ඩලික සහකාරවරුන්

දෙවන පංතිය - මාණ්ඩලික නොවන පංතිවලට අයත් නිලධාරීන් (මා. නො. IV සහ V හැර) සුළු සේවක නිදන මැදිරි ලබාගැනීම සඳහා අයදුම්කරු ස්ථිර වශයෙන් දැනුම් දීමෙන් පසු, ඇතිවන අවබෝධය මත නිදන මැදිරි නිකුත් කරනු ලැබේ. තමාට නියමිත පංතියට වඩා ඉහළ පංතියක ගමන් කිරීමට කැමති ඉල්ලුම්කරුවෙකුට ගාස්තු වෙනස ගෙවා එසේ ප්‍රවේශපත්‍ර ලබාගත හැකිය.

# සොඳුරු ඇබැද්දියක්

සුවිසි වියෙහි මා සිටියේ බොරැල්ලේ
අසලම පිහිටියේ මහ ඉස්පිරිතාලේ
නිතරම හමු උනා තරුණියො නිදැල්ලේ
ඉන් වැඩි දෙනා රෝහල් හෙදි මඩුල්ලේ

සිටිනාකල්හි මෙලෙසින් ඒ පෙදෙස්හී
හෙදියෝ සමවියේ වූ මිතුරියන් සහී
එනමුත් මගේ පෙම්දම් කිසිවිටක නොහී
එහෙයින් සැවොම විය සම මිතුරියන් එහී

මිතුරන් මිතුරියන් අවසන් වටයන්හී
දක්නට ලැබිණ පෙම්කෙළිනා මඟතොටෙහී
උන් හැමදෙනම මට සැළකුවෙ එකම ගෙහී
මා හැමදෙනාගෙම මිතුරෙක් විය එහී

අප හැම එක්ව යන්නේ දිගු චාරිකා
යන එන ගමන්වල මා තනි එකම එකා
ඒ හැම සිටිය හෙදියෝ තනි එකින් එකා
සැමවිට මා වටා රොක් වූ පොරය කකා

මා පිළිබඳව තතු ඒ හැම දත්තෝය
මගෙ ගතසිත මෙන්ම වැඩ හැම සෑහීය
හෙදියෝ තනි තනිව මා හැම පැතුවෝය
කුමකින් කුමක් වුවත් සිත නොසැලීය

ආරාධනාවන් මට හෙදි මඩුල්ලෙන්
ලැබුණා දිනක් යන්නට චාරිකා එවන්
වැඩිදුර නොයා, යාහැකි තැන් එකින් එකින්
තෝරාගනු ලැබී දෙහිවල වත්ත සතුන්

පසුදින රොක්වීමු අපි හැම එක් තැනෙක
සිටියෝ ලියෝ රූබර විසිතිස් වියෙක
පෙම්වතු යුවලයෝ එහි සිටියෝ දෙකෙක
තනි තනි ලියෝ සිටියෝ එහි පස්දෙනෙක

ඒ ගිය ගමන තාමත් මතකය එලෙසයි
මා එහි ගියේ නිකමට තනිකමට තමයි
තනි තනි ලියෝ සිටියෝ මා ලඟම තමයි
ඔක්කෝටම හිටිය කුකුලා මා පමණයි

අප හැම මහත් සතුටිනි සිරි නරඹන්නේ
මගෙ අත තවත් එකියක අත දැවටෙන්නේ
රූබර ලඳක් මගෙ උරහිස එල්ලෙන්නේ
මෙහෙමත් සැපක් කවදද මතු එළඹෙන්නේ

සිහබේනුවක පැටවුන් සහ ගුහාවක
දරු සෙනෙහසින් උන් රැකසිටි වෙලාවක
පනිනට නොහැකියැ'යි සිතමින් මුලාවෙක
කොළුගැටයෙක් ඇවිත් ගලකින් ගැසූවෙක

ඒ ගල වැදී සිහබේනුව හිස මතට
කිපුනෙන් වහා පැන්නෙන් ගුහා පිටතට
හටයෝ සිටි එතැන, පීකරගෙන අතට
මහ හඬ නගා කීයහ මෙපුවත අපට

කුමකින් කුමක් වීදැ'යි ඔබ දන්නෙහිද?
සිහබේනුව පැන්නෙ අපහුන් තැන නොවෙද
පීකරවලින් බෙරිහන් දුන්විට එසඳ
සී සී කඩ දුවන්නට වූ හැම නිබඳ

පෙම්වතියෝ තම තම පෙම්වතුන් බඳ
දෙනෙතුන් පියා, තදකොට තරයේ වැළඳ
සිටියෝ පසක් කරගත නොහැකිව එසඳ
දිවි යා නොහී බේරෙන්නට මගක් සොඳ

කරගන්නට කිසිත් නොහැකිවසිටිය ලඳුන්
මා වටකර බදාගත්තෙන් සැවොම තදින්
මා ඇඟ පුරා වැදුනා සුමුදු මුදු එතැන්
හැම පැත්තෙන්ම බැලුවම ඇඟපුරා එවන්

මගෙ මතකයට ආවා පැස්බර පුවත
බියපත් පැස්බරා වැල්ලේ මුව වසත
දිව යන්නට තැනක් නොම විය මෑත
මා වටකර බදාගනු හැර නොවිය සිත

මෙකියන පුවතෙ මා හැගි අන් අරුත් ඇත
එලඳුහු බදාගත්තෝ මා ගැනම සිත
තනිතනිවම සිතුවෙ මා හැරදා නොයත
මා බේරාගන්ට විය සැමගේම සිත

තම ජීවිතය පරදුවටම තැබුවෝය
ආරක්ෂිත වැටෙන් වටකර ගත්තෝය
මා බේරන්ට අන් මඟකුත් නොවුනාය
ඒ ගැන මගේ ඇතිවිය මහ කරුණාය

බෙරිහන් දුන්නා පීකරය නැවත වරක්
''සිහබේනුව පැන්නා ලෙනටම'' කියා පසක්
ටික මොහොතයි තිබුණෙ මාහැඟි එවන් සැපක්
මා අතහැරියොතරුණියො නොසිතා දෙවරක්

මගෙ මතකයට ආවා මෙය කිහිපවරක්
''නැවතත් මෙහෙමවේවා'' යැයි පතන සිතක්
වෙන්නට එපා ඉරිසිය නම් කිසිම කෙනෙක්
මට හිතෙනවා මා කොට ඇති මහඟු පිනක්

අමතක නොවන ගමණක් විය ඒ ගමන
පසුදින පුවත්පත්හිද පලවී තිබිණ
"සිහබේනුවක පැන පිටතට ගුහාවෙන
ගලකින් ගැසූ කොළුවම කෑ හැටි සැනින"

**ර. මු. සෙනෙවිරත්න**

## 'සැඳෑව'ට ලියන ඔබේ දැන ගැනීම සඳහා

සෞඛ්‍ය හේතූන් මත තාවකාලිකව මුදාහරින ලෙස ගරු සංස්කාරක අමරපාල කරසිංහආරච්චි මහතා විධායක කමිටුවෙන් ඉල්ලා සිටි බැවින් ඒ වෙනුවට ර.මු. සෙනෙවිරත්න මයතා ගරු සංස්කාරක වශයෙන් පත් කර ඇත.

<u>ඔබේ ලිපි තැපැල් මගින් එවනු ලබන්නේ නම් පහත සඳහන් ලිපිනයන් දෙකෙන් එකකට එවන්න.</u>

| | |
|---|---|
| ර.මු. සෙනෙවිරත්න මහතා<br>නො.172/4 ඇල්විටිගල මාවත<br>රත්මල්දෙනිය<br>පන්නිපිටිය<br>011 - 2845054 | බන්දුල විමලසූරිය මහතා<br>"ජයවිමල"<br>5 මාවත, කැන්දහේන,<br>දෙපානම, පන්නිපිටිය.<br>011 - 2840305 / 071 - 8156892 |

එසේම ඔබේ ලිපි විද්‍යුත් තැපෑල හෙවත් ඊමේල් හරහා එවන්නේ නම් ඒවා පහත ලිපිනයට යොමු කරන්න.

*wimalajaya@gmail.com*

ඔබේ සිංහල ලිපි **එෆ්.එම්. බින්දුමතී** හා ඉංග්‍රීසි ලිපි Times New Roman යන අකුරු භාවිතා කර Microsoft - word වලින් සකස් කරන්න. දෙමළ භාෂාව සඳහා (ටැමිල් ටයිපින්) RAVID අකුරු භාවිතා කරන්න. PDF ආකාරයෙන් ලිපි එවන්න එපා. යම් ගැටළුවක් ඇත්නම් "සැඳෑව" සංස්කාරකවරු අමතන්න.

**"සැඳෑව" ඔබේ සඟරාව බැවින් ඔබේ අදහස් නොපමාව අප වෙත දන්වා එවන්න.**


# සැඳෑව
# சந்தாவ

**ශ්‍රී ලංකා**
**මහ බැංකු විශ්‍රාමිකයන්ගේ**
**සංගමය**
**2017 ජූලි - දෙසැම්බර්**

**වෙබ් අඩවිය :** www.sendewa.org
**විද්‍යුත් ලිපිනය :** wimalajaya@gmail.com





**අංක :** QD/50/පුවත්/2018 **යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.**



**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය,**
**104/8, කුරේ පෙදෙස,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත,**
**නුගේගොඩ**



**රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.**

*අක්ෂර සංයෝජනය සහ පිටු සැකසුම : පීචනී හෙට්ටිආරච්චි*

Typesetting -
**Dinakara Computers & Communication**
Old Road, Pannipitiya. 0112 746891